# කාර්යසාධන වාර්තාව
## செயற்திறன் அறிக்கை
# Performance Report 2015

### අග්‍රාමාත්‍ය කාර්යාලය
### பிரதம அமைச்சர் அலுவலகம்
### PRIME MINISTER'S OFFICE



# කාර්යසාධන වාර්තාව
2015

# <u>පටුන</u>


| | පිටු අංකය |
|---|---|
| **1. හැඳින්වීම** | |
| 1.1 දැක්ම……………………………………………………………………….. | 01 |
| 1.2 මෙහෙවර………………………………………………………………… | 01 |
| 1.3 කාර්යභාරය…………………………………………………………… | 01 |
| **2. ජාත්‍යන්තර සහයෝගීතාවය වර්ධනය** | |
| 2.1 අග්‍රාමාත්‍යවරයාගේ නිල විදේශ සංචාර………………………………… | 03 |
| 2.1.1 ඉන්දීය සංචාරය……………………………………………...................... | 03 |
| 2.1.2 ජපාන සංචාරය………………………………………………..................... | 08 |
| 2.1.3 සිංගප්පූරු සංචාරය…………………………………………..................... | 12 |
| 2.2 රාජ්‍යතාන්ත්‍රිකයන් සහ විදේශ නියෝජිතයන් හමුවීම………………………… | 14 |
| **3. ප්‍රතිපත්ති සම්පාදන හා ආර්ථික සංවර්ධන කටයුතු** | |
| 3.1 ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව................................ | 17 |
| 3.2 ආර්ථික කළමනාකරණය පිළිබඳ නිලධාරී කමිටුව.......................................... | 27 |
| 3.3 ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලය පිහිටුවීම .......................................................... | 28 |
| 3.4 ප්‍රතිපත්ති සැකසීම සඳහා පත් කරන ලද අධ්‍යයන කමිටු...................................... | 29 |
| 3.4.1 ආයෝජන, දිරි දීමනා සහ බදු පිළිබඳ අධ්‍යයන කමිටුව........................... | 29 |
| 3.4.2 "ජාතික විශ්‍රාම වැටුප් කාර්යාලය සහ විශ්‍රාම වැටුප් උපදේශක කමිටුව පිහිටුවීම" පිළිබඳ අධ්‍යයන කමිටුව.......................................................... | 30 |
| 3.4.3 මැදි ආදායම්ලාභීන් සඳහා නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් පත් කරන ලද අධ්‍යයන කමිටුව............................................ | 30 |
| 3.4.4 ක්‍රීඩා නීතිය පිළිබඳ අධ්‍යයන කමිටුව..................................................... | 31 |
| 3.4.5 පාර්ලිමේන්තු පරිපාලනය පිළිබඳ අධ්‍යයන කමිටුව................................ | 33 |
| 3.4.6 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව.......................................................................................... | 34 |
| 3.4.7 යුරෝපා සංගම් ධීවර තහනම ඉවත්කර ගැනීමට අදාල මෙහෙයුම් කමිටුව | 34 |
| 3.4.8 රාජ්‍ය මූල්‍ය කළමනාකරණයට අදාළ නීති කෙටුම්පත් කිරීමේ කමිටුව...... | 35 |
| 3.4.9 කොළඹ සංස්කෘතික කේන්ද්‍රස්ථානය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීමේ කමිටුව.................................................................... | 35 |

**4. ජාතික සංහිඳියාව, සමාජ සුහසාධනය සහ ආගමික කටයුතු**

4.1 ජාතික සංහිඳියාව 36

4.1.1 අග්‍රාමාත්‍යවරයාගේ උතුරු පළාත් සංචාරය........................................ 36

4.2 සමාජ සුහසාධනය හා ආගමික කටයුතු.......................................................... 39

**5. මහජන පැමිණිලි හා දුක්ගැනවිලි සඳහා සහන සැලසීම**

5.1 අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලැබෙන මහජන පැමිණිලි / දුක් ගැනවිලි අදාළ රාජ්‍ය ආයතන වෙත යොමු කිරීම.................................................................. 47

5.2 අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය මඟින් මහජන පැමිණිලි / දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට සලසා ඇති පහසුකම්................................................ 49

**6. පාර්ලිමේන්තු කටයුතු හා අනෙකුත් කාර්යභාරයන්**

6.1 අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල සටහන්, පනත් කෙටුම්පත් සහ පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම .................................................. 50

6.2 විදේශ නිවාඩු .......................................................................... 51

**7. මානව සම්පත් සංවර්ධනය, යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම හා මූල්‍ය ප්‍රගතිය**

7.1 මානව සම්පත් සංවර්ධනය ............................................................................ 53

7.2 අග්‍රාමාත්‍ය කාර්යාලයේ ඵලදායිතාවය වර්ධනය කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම........................................................... 55

7.3 මූල්‍ය ප්‍රගතිය........................................................................................... 57

# 1. හැඳින්වීම

## 1.1 දැක්ම

" සෞභාග්‍යමත් ශ්‍රී ලංකාවක් "

## 1.2 මෙහෙවර

" ශ්‍රී ලාංකීය ජනතාවගේ අපේක්ෂාවන් මල්ඵල ගැන්වීම පිණිසත්, ඔවුන්ගේ ජීවන තත්ත්වය නංවාලීම පිණිසත්, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින්, යහපාලනයෙන් යුත් විශිෂ්ට රාජ්‍ය යාන්ත්‍රණයක් උදෙසා අවැසි මඟ පෙන්වීම "

## 1.3 කාර්යභාරය

අග්‍රාමාත්‍ය කාර්යාලය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අග්‍රාමාත්‍යවරයාගේ නිල රාජකාරි කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දෙනු ලබන කාර්යාලයයි. එමෙන්ම, රජයේ සංවර්ධන ප්‍රතිපත්ති ප්‍රකාශය වන **"මාස 60 කින් අලුත් රටක් හදන පංච විධ ක්‍රියාවලිය"** ප්‍රකාරව දේශීය ආර්ථිකය දියුණු කිරීම, දූෂණය මුලිනුපුටා දැමීම, නිදහස තහවුරු කිරීම, යටිතල පහසුකම් සඳහා ආයෝජන  අවස්ථා ඇති කිරීම, අධ්‍යාපන මට්ටම හා එහි ගුණාත්මකභාවය ඉහළ නැංවීම යන ක්‍රියාවලියන් තුළින් දැයේ සුභ සිද්ධිය ඇති කිරීම සඳහා කටයුතු කිරීමට සහාය වීම මෙම කාර්යාලයේ කාර්යභාරය වේ.

ඒ අනුව,

1. රජයේ ප්‍රතිපත්ති සහ තීරණ ක්‍රියාවට නැංවීම සඳහා සහාය ලබාදීම
2. අග්‍රාමාත්‍යවරයා මුලසුන හොබවන විවිධ කමිටු හා රැස්වීම් සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම සම්බන්ධීකරණය හා ඒවායේ ප්‍රගතිය පසුවිපරම් කිරීම
3. අග්‍රාමාත්‍යවරයාගෙන් පාර්ලිමේන්තුවේදී විමසනු ලබන ප්‍රශ්න වලට පිළිතුරු සැකසීම
4. අග්‍රාමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩලයට යොමු කරන අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල සටහන්, පනත් කෙටුම්පත් වලට අදාළ කටයුතු කිරීම
5. අග්‍රාමාත්‍යවරයාට විදේශ දූත මණ්ඩල, විදේශ තානාපති සේවයේ නිලධාරීන් සමඟ සම්බන්ධතා පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සලසාදීම
6. අග්‍රාමාත්‍යවරයාගේ විදේශ සංචාර සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය හා මෙහෙයවීම
7. අග්‍රාමාත්‍යවරයා ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගීවන රාජ්‍ය හා ජාතික උත්සව සහ විශේෂ අවස්ථා සඳහා මාධ්‍ය ආවරණය සැලසීම
8. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට හා රාජ්‍ය නිලධාරීන්ට විවිධ කටයුතු සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව යාම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ අවසරය ලබාදීම

9. විශේෂ ආගමික උත්සව සහ සමාජ සත්කාරක සේවාවන් රාජ්‍ය අනුග්‍රහය සහිතව සංවිධානය කිරීම සහ පැවැත්වීම
10. අග්‍රාමාත්‍යවරයා වෙත යොමු කර ඇති මහජන පැමිණිලි හා දුක්ගැනවිලි, අදාළ ආයතන වෙත යොමු කර සහන සැලසීමට අවශ්‍ය කටයුතු කිරීම
11. අරලියගහ මන්දිරය, අග්‍රාමාත්‍ය කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ නිල නිවාස සහ සංචාරක බංගලා නිසි පරිදි නඩත්තු කිරීම හා පවත්වාගෙන යාම
12. අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධාරීන් පුහුණු කිරීම හා දිරි ගැන්වීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
13. අග්‍රාමාත්‍ය කාර්යාලයේ පරිපාලන හා සංවර්ධන කටයුතු ඉටුකිරීම

## 2. ජාත්‍යන්තර සහයෝගීතාවය වර්ධනය

### 2.1. අග්‍රාමාත්‍යවරයාගේ නිල විදේශ සංචාර

අග්‍රාමාත්‍යවරයා විදේශිය රටවල් හා ජාත්‍යන්තර සංවිධාන සමඟ ආර්ථික, සාමාජීය, දේශපාලනික, පාරිසරික, ආගමික හා සංස්කෘතික ආදී වශයෙන් සෑම අංශයක් පිළිබඳවම අන්‍යෝන්‍ය සම්බන්ධතාවන් පුළුල් කිරීමේ අරමුණින් රාජ්‍ය තාන්ත්‍රිකයන් හා ජාත්‍යන්තර සංවිධාන නියෝජිතයන් විශාල සංඛ්‍යාවක් මුණගැසුණු අතර ඒ පිළිබඳව සාරාංශයක් පහත දැක්වේ.

#### 2.1.1. ඉන්දීය සංචාරය



ශ්‍රී ලංකාවට සමීපතම මිත්‍ර රාජ්‍යය වන ඉන්දියාව සමඟ පුරාතනයේ සිට පැවත එන සබඳතා තවදුරටත් වැඩි දියුණු කරමින් ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා, සිය ප්‍රථම නිල විදේශ සංචාරය ලෙස 2015 සැප්තැම්බර් මස 14 - 16 දින වලදි ඉන්දීය සංචාරය සිදු කරන ලදී. ජාතික සංහිඳියාව ශක්තිමත් කරලීම සඳහා වඩාත් සුදුසු දේශපාලන වාතාවරණයක් මේ වන විට ශ්‍රී ලංකාව තුළ ඇති වී තිබෙන බවත්, එය ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවත්නා ඓතිහාසික සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීමට හේතු වන බවත් සඳහන් කළ ඉන්දියානු ජනාධිපති ප්‍රනාබ් මුකර්ජි මැතිතුමා විසින් ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයාට හා නව රජයට ඉදිරි කටයුතු සාර්ථකව කරගෙන යාම සඳහා සිය සුභ පැතුම් පුද කරන ලදී.

ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා හා ශ්‍රී ලංකා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා හමුවූ අවස්ථාවේදි, ඉන්දීය ජනතාව හා ඉන්දීය රජය ශ්‍රී ලංකාවේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා හා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා පිළිබඳව පූර්ණ විශ්වාසය තබා ඇති බවත්, ජාත්‍යන්තර මට්ටමේදී ශ්‍රී ලංකාව වෙනුවෙන් පූර්ණ සහාය ලබා දීමට සූදානම් බවත්, ශ්‍රී ලංකාවේ යටිතල පහසුකම්, ආර්ථික, බලශක්ති, සංචාරක, අධ්‍යාපන, ආගමික, සංස්කෘතික, කෘෂිකාර්මික, ප්‍රවාහන ආදී විවිධ ක්ෂේත්‍රයන්හි සංවර්ධනය සඳහා අවශ්‍ය සහයෝගය ලබා දෙන බවටත් ප්‍රකාශ කරන ලදී.

ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයාගේ මෙම නිල සංචාරය තුළ දී ඉන්දීය රජය සමඟ ශ්‍රී ලංකා නව රජයේ සංවර්ධන වැඩසටහන් වේගවත් කිරීමට උපකාරීවන පහත දැක්වෙන ගිවිසුම් සඳහා අත්සන් තබන ලදී.

(I) පළාත් පාලන ආයතන, රාජ්‍ය නොවන සංවිධාන, අධ්‍යාපන වෘත්තීය පුහුණු ආයතන හරහා කුඩා සංවර්ධන ව්‍යාපෘතිවලට සහාය සහ ආධාර සැපයීම

(II) වව්නියාව දිස්ත්‍රික් රෝහලේ ඇඳන් 200 කින් සමන්විත වාට්ටුව සඳහා ඉන්දියාව විසින් සියලුම වෛද්‍ය උපකරණ ලබාදීම

(III) ශ්‍රී ලංකාව තුළ හදිසි ගිලන් රථ සේවාවක් ස්ථාපිත කිරීම සඳහා ඉන්දීය රජයේ ආධාර සැපයීම

මීට අමතරව දෙපාර්ශවය විසින් දකුණු ආසියානු කලාපීය චන්ද්‍රිකා පණිවිඩ හුවමාරු ව්‍යාපෘතිය සඳහා වූ අවබෝධතා ගිවිසුම සඳහා ද අත්සන් තබන ලදී.

මෙම නිල සංචාරයේ දී අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා ඉන්දීය විදේශ ඇමතිනී ගරු සුෂ්මා ස්වරාජ් මහත්මිය මුණගැසුනු අතර එහිදී එතුමිය, ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර පවත්නා දේශපාලන හා සමාජ සම්බන්ධතා ශක්තිමත් කරලීමට නිරතුරුවම රනිල් වික්‍රමසිංහ මහතාගෙන් ලැබුණු සහයෝගය අතිශය අගය කරන බව ප්‍රකාශ කර ඇත.

මෙම හමුවේ දී ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යතුමා විසින් සාගර කලාපීය ආරක්ෂාව පිළිබඳ පූර්ණ සමාලෝචනයක් සිදු කිරීම වඩාත් යහපත් බව ප්‍රකාශ කරන ලදී. මෙම සංචාරයේ දී ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා හා ඉන්දීය මුදල් අමාත්‍යවරයා අතර පැවැති දීර්ඝ සාකච්ඡාවේ දී ඉන්දියානු ආයෝජකයින් හා විදේශ සංචාරකයින් මෙරටට ගෙන්වා ගැනීම ඇතුළුව වෙනත් කරුණු රැසක් සාකච්ජා කරන ලදී.

මෙම නිල සංචාරයේ දී අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා විසින් ඇතිකරගත් එකඟතාවයන්ට අනුව ශ්‍රී ලංකාවේ විවිධ ක්ෂේත්‍රයන් සංවර්ධනය කිරීම සඳහා යෝජිත වැඩසටහන් හා ව්‍යාපෘති විවිධ අමාත්‍යාංශ මඟින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර ඒවා පහත පරිදි වේ.

| අනු අංකය | වැඩසටහන/ව්‍යාපෘතිය | වගකීම් පැවරෙන අමාත්‍යාංශ |
|---|---|---|
| 01 | ඉන්දු ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම අත්සන් කිරීමට අවශ්‍ය පියවර ගැනීම | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශය<br><br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 02 | ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ආරක්ෂාව පිළිබඳ සහයෝගීතාවය ඇති කිරීම හා මත්ද්‍රව්‍ය නිවාරණයට අවශ්‍ය කටයුතු සිදු කිරීම | ආරක්ෂක අමාත්‍යාංශය<br>විදේශ කටයුතු අමාත්‍යාංශය<br><br>නීතිය සාමය හා දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය<br><br>බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය |
| 03 | උතුරු හා නැගෙනහිර පළාත් කේන්ද්‍ර කොටගෙන ඉන්දීය රජයේ ආධාර සහිතව හදිසි ගිලන් රථ සේවා ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය |
| 04 | යෝජිත තෙල් පිරිපහදු හා තෙල් ටැංකි ඉදි කිරීම් සම්බන්ධව බද්ධ ව්‍යාපාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම<br><br>ගෑස් නිධි ගවේෂණය සඳහා ඉන්දීය සමාගම්වල සහාය ලබා ගැනීම<br><br>ඛණිජ තෙල් සඳහා නම්‍යශීලී මිල සූත්‍රයක් හඳුන්වාදීම<br><br>සපුගස්කන්ද තෙල් පිරිපහදුව නැවත ප්‍රතිනිශ්චනය කිරීම<br><br>තෙල් ගවේෂණය සඳහා යෝජනා කැඳවීමේදී ඉන්දීය සමාගම් සඳහා ද ලංසු ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම<br><br>මෙරට තුළ ඉන්දීය තෙල් සමාගමේ ශාඛා විවෘත කිරීම වේගවත් කිරීම | ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය |
| 05 | වතු ආශ්‍රිත ප්‍රදේශයන් හි දෙමළ මාධ්‍ය පාසල්වල විද්‍යා විෂය ධාරාවෙන් අධ්‍යාපන කටයුතු සංවර්ධනය කිරීම | අධ්‍යාපන අමාත්‍යාංශය |
| 06 | ත්‍රිකුණාමලය සංවර්ධනය කිරීම | මහානගර සහ බස්නාහිර සංවර්ධනය අමාත්‍යාංශය<br><br>නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය |

| අනු අංකය | වැඩසටහන | වගකීම් පැවරෙන අමාත්‍යාංශය |
|---|---|---|
| 07 | උතුරු හා නැගෙනහිර පළාත්වල නිවාස සහ මූලික යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය<br><br>නිවාස සහ ඉදිකිරීම් අමාත්‍යාංශය |
| 08 | ඉන්දීය අග්‍රාමාත්‍යතුමාට හා ඉන්දීය රජයේ වැදගත් අමාත්‍යවරුන්ට ශ්‍රී ලංකාවට පැමිණෙන ලෙස ආරාධනා කිරීම හා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට තේරී පත් වූ නවක මන්ත්‍රීවරුන්ට ඉන්දියාවේ සංචාරය සඳහා අවස්ථාව ලබාදීම | විදේශ කටයුතු අමාත්‍යාංශය<br><br>පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය |
| 09 | සාම්පූර් හි ගල් අඟුරු බලාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | ඛණිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය<br><br>විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය |
| 10 | i. ඉන්දියානු ආයෝජකයින් මෙරටට ගෙන්වා ගැනීමට විශේෂ ආයෝජන කලාප ඇති කිරීම<br>ii. ඖෂධ හා ඇඟළුම් අංශයන් හි වෙළඳාම් හා ආයෝජන කටයුතු ශක්තිමත් කිරීම<br>iii. ඉන්දියානු ආයෝජකයින්ගේ විධායක නිලධාරීන්ගේ සමුළුව 2016 , පෙබරවාරි මස 20 වන දිනට පෙර ශ්‍රී ලංකාවේ දී පැවැත්වීම<br>iv. විශේෂ ආර්ථික කලාපයක් ත්‍රිකුණාමලයේ පිහිටුවීම | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශය |
| 11 | ජාත්‍යන්තර බෞද්ධ සමුළුව ශ්‍රී ලංකාවේ දී පැවැත්වීම | බුද්ධශාසන අමාත්‍යාංශය |
| 12 | පලාලි ගුවන්තොටුපල දක්වා සෘජු ගුවන් ගමන් ඇති කිරීම<br><br>කන්කසන්තුරය වරාය නැවත ස්ථාපිත කිරීම<br><br>තුත්තුකුඩිය, කොළඹ, රාමේෂ්වරම් හා මන්නාරම අතර පාරු සේවාවක් ආරම්භ කිරීම | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය<br><br>ආරක්ෂක අමාත්‍යාංශය<br><br>විදේශ කටයුතු අමාත්‍යාංශය |
| 13 | තීරුබදු නොවන බාධා ඉවත් කිරීම | මුදල් අමාත්‍යාංශය |
| 14 | ඉහළ වටිනාකමකින් යුත් කෘෂිකාර්මික නිෂ්පාදන බිහි කිරීම සඳහා රාජ්‍ය විශ්වවිද්‍යාල වල සහයෝගය ලබාගැනීම | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය<br><br>කෘෂිකර්ම අමාත්‍යාංශය |

| අනු අංකය | වැඩසටහන | වගකීම් පැවරෙන අමාත්‍යාංශය |
|---|---|---|
| 15 | සූර්ය බලශක්ති හා සුළං බලශක්ති ව්‍යාපෘතිය සඳහා අක්කර 500ක් වෙන් කිරීම | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය |
| 16 | ශ්‍රී ලංකාව හා ඉන්දියාව අතර ගුවන් පාලමක් ඉදිකිරීමට කටයුතු කිරීම | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය |
| 17 | ශ්‍රී ලාංකික හා ඉන්දියානු ධීවරයින්ගේ ගැටලු විසඳීම | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය |
| 18 | විශාල ප්‍රමාණයේ නැව් භාණ්ඩ ප්‍රවාහනය සඳහා වරාය සංවර්ධනය කිරීම | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය |
| 19 | ශ්‍රී ලංකාවේ දුම්රිය මාර්ග සංවර්ධනය කිරීම<br><br>සංචාරක අංශය සංවර්ධනය සඳහා ඒකාබද්ධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම | ප්‍රවාහන අමාත්‍යාංශය |
| 20 | සංචාරක ක්ෂේත්‍රයේ ඉන්දියානු ආයෝජන අවස්ථා වැඩි දියුණු කිරීම | සංචාරක හා ක්‍රිස්තියානි කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |
| 21 | රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ව්‍යාපෘතියක් ලෙස පලාලි ගුවන්තොටුපල සංවර්ධනය කිරීම | ආරක්ෂක අමාත්‍යාංශය |

## 2.1.2 ජපාන සංචාරය



ජපාන අග්‍රාමාත්‍යතුමාගේ ආරාධනය පිළිගනිමින් වර්ෂ 2015 ඔක්තෝබර් 4 සිට 7 දක්වා ජපානයේ නිල සංචාරයක නියැලි ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය, සංස්කෘතික, දේශපාලනික, අධ්‍යාපනික හා තාක්ෂණික අංශයන් ද ඇතුළුව ක්ෂේත්‍ර කිහිපයකට ආදාළ වැදගත් තීරණ රාශියකට එළඹ ඇත.

මෙම සංචාරයේදී ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා ජපාන ගරු අග්‍රාමාත්‍යතුමා ඇතුළුව ජපානයේ සුවිශේෂී පුද්ගලයින් රැසක් මුණගැසී ශ්‍රී ලංකාවේ ඉදිරි  සංවර්ධන ක්‍රියාදාමය ශක්තිමත් කිරීමට අවශ්‍ය මූලික පියවර ගෙන ඇත. ඒ අනුව ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනයේ හා සංවර්ධනයේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් " විස්තීර්ණ හවුල්කාරිත්වයක් " යටතේ පහත දැක්වෙන බහු ආංශික ක්ෂේත්‍රවල වර්ධනයක් දෙරට අතර ඇති කිරීමට තීරණය කරන ලදී.

ඒ අනුව,

i. ආයෝජනය හා වෙළඳාම ප්‍රවර්ධනය කිරීම
ii. ශ්‍රී ලංකා ජාතික සංවර්ධන සැලැස්ම පිළිබඳව සහයෝගිතාව ඇති කිරීම
iii. ජාතික ප්‍රතිසන්ධානය හා සාම සාධනය ඇති කිරීම සඳහා මූලික පියවර ගැනීම

ඉහත සඳහන් අරමුණු ඉටුකර ගැනීම සඳහා අදාළ අමාත්‍යාංශ වලට පහත සඳහන් පරිදි වගකීම් පවරා ඇත.

එම වැඩසටහන් හා අමාත්‍යාංශ පහත පරිදි වේ.

| අනු අංකය | වැඩසටහන | වගකීම් පැවරෙන අමාත්‍යාංශ |
|---|---|---|
| 01 | කලාපීය විද්‍යාඥයින් සහභාගි කර ගනිමින් විද්‍යා හා තාක්ෂණික සමාජ සමුළුව ශ්‍රී ලංකාවේ පැවැත්වීම<br>(මෙහිදී ජපාන විද්‍යාඥයින් ශ්‍රී ලංකාවට ගෙන්වාගෙන ඔවුන් සමඟ දේශීය විද්‍යාඥයින් සංවාදයේ යෙදවීමට බලාපොරොත්තු වේ.) | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය |
| 02 | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල සංවර්ධන ව්‍යාපෘතිය පුළුල් කිරීම<br>පර්යන්ත ගොඩනැගිලි හා ගුවන් යානා ධාවන පථ ඉදි කිරීම<br>බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල දකුණු ආසියානු කලාපයේ කේන්ද්‍රීය ගුවන් තොටුපලක් බවට පත් කිරීම | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය |
| 03 | රූපවාහිනී විකාශන කටයුතු ඩිජිටල්කරණය පිළිබඳව ජපාන යෝජනාව ක්‍රියාත්මක කිරීම | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය |
| 04 | ජපාන පුද්ගලික සමාගම් මෙරට ආයෝජනය සඳහා යොමු කරවා ගැනිම | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශය |
| 05 | ව්‍යාපාර කටයුතු කිරීමට පවතින මූලා බාධාවන් හා සීමා ඉවත් කරමින් ඉදිරි පරම්පරාව සඳහා ආර්ථික ප්‍රතිසංස්කරණ සිදුකිරීම හා නිදහස් වෙළඳ ගිවිසුම් ඇති කිරීම | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශය |
| 06 | එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ ස්ථිර ආසනයක් සඳහා ජපානය කරන ඉල්ලීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජයේ සහයෝගය අඛණ්ඩව ලබා දීම | විදේශ කටයුතු අමාත්‍යාංශය |
| 07 | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා ජපානයේ ව්‍යාපාරික ආයතන සමඟ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ඒකාබද්ධ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීම | මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය<br>නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය |
| 08 | හම්බන්තොට වරාය සහන වරාය ගාස්තු අයකරමින් සේවා සපයන වරායක් බවට පත්කිරීම | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය |
| 09 | ශ්‍රී ලංකාව හා ජපානය අතර දේශපාලන හා ආර්ථික කරුණු පිළිබඳ දෙරටේම ඉහළ තලයේ ඇමතිවරුන් හා නිලධාරීන් සමඟ සාකච්ඡා කිරීම | විදේශ කටයුතු අමාත්‍යාංශය |

| අනු අංකය | වැඩසටහන | වගකීම් පැවරෙන අමාත්‍යාංශය |
| --- | --- | --- |
| 10 | ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳව විස්තරාත්මකව අධ්‍යයනයක් කිරීම | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 11 | කොළඹ හා ත්‍රිකුණාමල වරායන් සංවර්ධනය කිරීම | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය |
| 12 | ජපාන රජයේ සහයෝගය ඇතුව ත්‍රිකුණාමලය සංවර්ධනය කිරීම | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය<br>සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශය |
| 13 | උතුරු හා නැගෙනහිර පළාත් සංවර්ධනය කිරීම | ග්‍රාමීය ආර්ථික පිළිබඳ අමාත්‍යාංශය<br>පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික අමාත්‍යාංශය |
| 14 | මහනුවර නගරය සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මහනුවර නගරය සංවර්ධනය කිරීම | මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය<br>නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය |
| 15 | සංස්කෘතික සංචාරක අංශය සහ පාරිසරික සංචාරක අංශය සංවර්ධනය කිරීම | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය |
| 16 | ශ්‍රී ලංකා රජයේ අයවැය සඳහා ජපාන රජයෙන් සහාය ලබාදීම | මුදල් අමාත්‍යාංශය<br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 17 | නාවුක ආරක්ෂාව වැඩි දියුණු කිරීම සඳහා කටයුතු කිරීම | ආරක්ෂක අමාත්‍යාංශය |
| 18 | කර්මාන්ත හා කෘෂිකර්මාන්ත ක්ෂේත්‍ර සංවර්ධනය සඳහා නව තාක්ෂණික දැනුම හුවමාරු කිරීම | කෘෂිකර්ම අමාත්‍යාංශය<br>ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය |
| 19 | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ගේ ආර්ථික ශක්තිය වැඩි දියුණු කිරීම | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 20 | ශ්‍රී ලංකා වරායන්ට ජපාන නෞකා ගෙන්වා ගැනීමට කටයුතු කිරීම | ආරක්ෂක අමාත්‍යාංශය |
| 21 | කොළඹ නැව් තාටාකාංගනය සංවර්ධනය කිරීම | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය |
| 22 | ශ්‍රී ලංකාවේ මානව සම්පත් සංවර්ධනය, ජාතිය ගොඩනැගීම හා යහපාලනය වැඩි දියුණු කිරීම සඳහා ජපාන සහයෝගය ලබා ගැනිම | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 23 | නොවැම්බර් මස 5 වන දින ලෝක සුනාමි දිනය ලෙස නම් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම | විදේශ කටයුතු අමාත්‍යාංශය |

ශ්‍රී ලංකාවේ නව ජාතික රජය උතුරු නැගෙනහිර ගැටුමෙන් පීඩාවට පත් ප්‍රජාවගේ සමාජ ආර්ථික ගැටලුවලට කඩිනමින් විසඳුම් සෙවීම සඳහා දරන උත්සාහයන් ජපාන අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රසාදයට ලක්විය.

මෙම නිල සංචාරයේ දී පහත කටයුතු සඳහා ද ජපාන රජයේ සහයෝගිතාවය ලැබුණි.

- ජල සැපයුම ඇතුළු ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය කිරීම
- මන්නාරමට අධ්‍යාපනික පහසුකම් ලබාදීමට අමතරව පාසල් ළමුන්ට ආහාර ලබාදීමේ වැඩසටහන දියුණු කිරීම
- විදුලිබල උත්පාදන හා බෙදාහැරීමේ ප්‍රධාන සැලසුම විධිමත්ව සකස් කිරීම ඇතුළුව විදුලිබල ක්ෂේත්‍රයේ සංවර්ධන කටයුතු සඳහා ජපාන රජයේ සහයෝගිතාවය ලබා ගැනීම
- අධිවේගී මාර්ග හා මහනුවර නගරයේ නාගරික සැලැස්ම වැනි ප්‍රධාන ව්‍යාපෘති සඳහා ජපානයේ උසස් විශේෂඥ දැනුම හා තාක්ෂණය යොදා ගැනීම

ජපානයේ නිල සංචාරයේ නියැලි ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා ශ්‍රී ලංකාවේ ඉදිරි සංවර්ධන ක්‍රියාදාමය ශක්තිමත් කිරීමට පමණක් නොව ජාත්‍යන්තර ප්‍රජාවගේ සංවර්ධනය සඳහා ඉවහල් වන කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම ද සුවිශේෂී කරුණකි. පැහැර ගැනීම් පිළිබඳ ප්‍රශ්නයට කඩිනමින් විසඳුමක් ලබාදීම ඇතුළුව ජාත්‍යන්තර ප්‍රජාවගේ ප්‍රශ්න කෙරෙහි යොමුවන ලෙස ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා හා ජපාන අග්‍රාමාත්‍යතුමා විසින් උතුරු කොරියාවෙන් නැවත ඉල්ලීමක් කරන ලදී. න්‍යෂ්ටික අවිවලින් තොර ලොවක් උදෙසා න්‍යෂ්ටික නිරායුධකරණය හා සම්බන්ධ ක්‍රියාවලීන් සඳහා හා එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ ප්‍රතිසංස්කරණ කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය සහයෝගය ලබාදීමට කටයුතු කරන බව මෙම සංචාරයේ දී අග්‍රාමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරන ලදී.

### 2.1.3 සිංගප්පූරු සංචාරය



ශ්‍රී ලංකා නව රජයේ අග්‍රාමාත්‍යවරයා ලෙස පත් වූ රනිල් වික්‍රමසිංහ මහතා, 2015 ඔක්තෝබර් මස 16 - 17 දිනවලදී සිංගප්පූරු නිල සංචාරයක නියැලි අතර එම සංචාරය තුළින් ශ්‍රී ලංකා නව රජය දැනට සිදු කරමින් පවත්නා සීඝ්‍ර සංවර්ධන ක්‍රියාදාමයට ඉවහල්වන කරුණු රාශියක් සාකච්ඡා කරන ලදී. මෙම නිල සංචාරයේ දී පැවති ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයාගේ හා සිංගප්පූරු අග්‍රාමාත්‍යවරයාගේ හමුවේදී දෙරට අතර දැනට පවතින සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කිරීමට ශ්‍රී ලංකාවේ නව දේශපාලන පසුබිම වඩාත් හිතකර බව සිංගප්පූරු අග්‍රාමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරන ලදී.

ශ්‍රී ලංකාව හා සිංගප්පූරුව අතර ඇති සම්බන්ධතාවය අධ්‍යාපන, ආර්ථික, තාක්ෂණික අංශයන් ඇතුළුව විවිධ අංශයන් හරහා ශක්තිමත් කිරීමට අවශ්‍ය අත්තිවාරම ශ්‍රී ලංකා අග්‍රාමාත්‍යවරයා විසින් මෙම නිල සංචාරයේ දී යොදන ලදී. ඒ අනුව ශ්‍රී ලංකාවේ සිවිල් සේවා නිලධාරීන් වෙත පුහුණු අවස්ථා සිංගප්පූරුවේදී ලබා දීමටත්, මෙරට පවතින පුහුණු ආයතනවල පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීමටත් සිංගප්පූරුවේ ආයෝජකයින් මෙරටට ගෙන්වා ගැනීමට හා නව වෙළඳ ගිවිසුම් සිංගප්පූරු රජය සමඟ ඇති කර ගැනීමටත් තීරණය කරන ලදී.

ඊට අමතරව පහත දැක්වෙන ක්‍රියාකාරකම් විවිධ අමාත්‍යාංශ හරහා සිදුකිරීමට අපේක්ෂා කෙරේ.

| අනු අංකය | වැඩසටහන | අමාත්‍යාංශය |
|---|---|---|
| 01 | ශ්‍රී ලංකාවේ සිවිල් සේවා නිලධාරීන් සඳහා පුහුණු අවස්ථා සිංගප්පූරුවේ දී ලබාදීම හා ඒ තුළින් රාජ්‍ය සේවය වේගවත් කිරිම<br><br>ශ්‍රී ලංකාවේ පවතින පුහුණු ආයතනවල පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය<br><br>මුදල් අමාත්‍යාංශය<br><br>ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br><br>උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය<br><br>පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය<br><br>අග්‍රාමාත්‍ය කාර්යාලය |
| 02 | සිංගප්පූරු ආයෝජකයින් සඳහා මෙරට ආයෝජන අවස්ථා ලබාදීම<br><br>වරාය හා ගුවන් තොටුපල ඒකාබද්ධ කිරීමේ කටයුතු සිදු කිරීම<br><br>ශ්‍රී ලංකාව හා සිංගප්පූරුව අතර නිදහස් වෙළඳ ගිවිසුම් ඇති කිරීමට කටයුතු කිරීම | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ කටයුතු අමාත්‍යාංශය |
| 03 | ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීම සඳහා නියෝජිත ආයතන ඇති කිරීම<br><br>උතුරු හා නැගෙනහිර පළාත් සංවර්ධනය කිරීම<br><br>එකතු කළ අගයක් සහිත කෘෂිකාර්මික නිෂ්පාදන බිහි කිරීමට සහාය වීම<br><br>තාක්ෂණ හා සංචාරක අංශයන්ට මූලිකත්වය ලබා දෙමින් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමට කටයුතු කිරීම | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය<br><br>මහානගර සහ බස්නාහිර සංවර්ධනය අමාත්‍යාංශය<br><br>දකුණු පළාත් සංවර්ධන අමාත්‍යාංශය<br>කෘෂිකර්ම අමාත්‍යාංශය<br><br>සංචාරක හා ක්‍රිස්තියානි කටයුතු පිළිබඳ අමාත්‍යාංශය<br><br>විද්‍යා හා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය |
| 04 | රාජ්‍ය ව්‍යවසාය නැවත ප්‍රතිසංස්කරණය සඳහා සැලසුම් සකස් කිරිම | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය |
| 05 | රාජ්‍ය සේවය වැඩි දියුණු කිරීමට කටයුතු කිරීම<br><br>ග්‍රාම රාජ්‍ය සංවර්ධන කේන්ද්‍ර 2500ක් ස්ථාපිත කිරීම | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණය පිළිබඳ අමාත්‍යාංශය<br>ස්වදේශ කටයුතු අමාත්‍යාංශය |

**2.2 රාජ්‍ය තාන්ත්‍රිකයින් සහ විදේශ නියෝජිතයින් හමුවීම**

| අංක | දිනය | මුණගැසුණු රාජ්‍ය තාන්ත්‍රිකයින් |
|---|---|---|
| 01 | 2015.01.15 | මාලදිවයිනේ හිටපු ජනාධිපති ගරු මොහොමඩ් නෂීඩ් මැතිතුමා (Hon. Mohamed Nasheed) |
| 02 | 2015.01.28 | බ්‍රිතාන්‍යයේ විදේශ කටයුතු සහ පොදු රාජ්‍ය මණ්ඩල කටයුතු පිළිබඳ අමාත්‍ය, ගරු හියුගෝ ස්වෛරි මැතිතුමා (Hon. Hugo Swire) |
| 03 | 2015.02.02 | පොදු රාජ්‍ය මණ්ඩල මහ ලේකම්, කමලේෂ් ෂර්මා මැතිතුමා (Mr. Kamalesh Sharma) |
| 04 | 2015.02.02 | ඇමරිකානු සහකාර රාජ්‍ය ලේකම්, නිෂා බිස්වාල් මහත්මිය (Ms. Nisha Biswal) |
| 05 | 2015.02.06 | චීන රජයේ විශේෂ නියෝජිත, ලියූ ජින්චාවෝ මැතිතුමා (Mr. Liu Jianchao) |
| 06 | 2015.02.20 | ලෝක බැංකුවේ දකුණු ආසියානු කලාපීය උප සභාපතිනි, ඇනට් ඩික්සන් මෙනවිය (Ms. Annette Dixon) |
| 07 | 2015.02.24 | සිංගප්පූරුවේ, විදේශ කටයුතු සහ නීතිය පිළිබඳ අමාත්‍ය, ගරු කේ. ෂන්මුගම් මැතිතුමා (Hon. K Shanmugam) |
| 08 | 2015.02.24 | දකුණු අප්‍රිකාවේ විදේශ කටයුතු පිළිබඳ නියෝජ්‍ය අමාත්‍ය, ගරු නොමයින්ඩියා මෆ්කෙතෝ මැතිතුමා (Hon. Nomaindiya Mfeketo) |
| 09 | 2015.02.25 | මැලේසියාවේ විශේෂ නියෝජිත දාතෝ සෙරි උතමා එස්. සාමි වේලු මැතිතුමා (Mr. Dato Seri Utama S Samy Vellu) |
| 10 | 2015.03.06 | යුරෝපා පාර්ලිමේන්තු සාමාජික ජැන් සරාඩිල් මහතා (Mr. Jan Zahradil) |
| 11 | 2015.03.07 | ඉන්දියානු විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය, ගරු සුෂ්මා ස්වරාජ් මැතිනිය (Hon. Sushma Swaraj) |
| 12 | 2015.03.07 | ජපානයේ විදේශ කටයුතු පිළිබඳ රාජ්‍ය අමාත්‍ය ගරු මිනෝරු කියුචි මැතිතුමා (Hon. Minoru Kiuchi) |
| 13 | 2015.03.13 | ඉන්දියානු අග්‍රාමාත්‍ය ගරු ශ්‍රී නරේන්ද්‍ර මෝදි මැතිතුමා (Hon.Shri Narendra Modi) |
| 14 | 2015.03.17 | ස්විස් ෆෙඩරල් රාජ්‍යයේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය, ගරු ආචාර්ය දිදියර් බක්හෝල්ටර් මැතිතුමා (Hon. Dr. Didier Burkhalter) |
| 15 | 2015.03.20 | බංගලාදේශය, භූතානය, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව පිළිබඳ ලෝක බැංකුවේ විධායක අධ්‍යක්ෂ, සුභාෂ් චන්ද්‍ර ගාජ් මහතා (Mr. Subash Chandra Garg) |

| අංක | දිනය | මුණගැසුණු රාජ්‍ය තාන්ත්‍රිකයින් |
|---|---|---|
| 16 | 2015.03.31 | පෝල් ගොරෙව් මහතාගේ ප්‍රධානත්වයෙන් යුත් ඇමරිකානු සංගමයේ නියෝජිතයින් (Mr. Paul Grove) |
| 17 | 2015.04.10 | භූතාන අග්‍රාමාත්‍ය ගරු ෂෙරින් ටොබ්ගේ මැතිතුමා (Hon. Tshering Tobgay) |
| 18 | 2015.05.02 | ඇමරිකා එක්සත් ජනපදයේ රාජ්‍ය ලේකම් ගරු ජෝන් කෙරි මැතිතුමා (Hon. John Kerry) |
| 19 | 2015.05.05 | ඕස්ට්‍රේලියාවේ ආගමන හා වෙරළ සංරක්ෂණ අමාත්‍ය ගරු පීටර් ඩටන් මැතිතුමා (Hon. Peter Dutton) |
| 20 | 2015.05.12 | ටාටා නිවාස සංවර්ධන සමාගමේ බ්‍රොටින් බනාර්ජි මහතා (Mr. Brotin Banerjee) |
| 21 | 2015.05.12 | වෙස්මිනිස්ටර් පදනමේ සමාජික කණ්ඩායම |
| 22 | 2015.05.21 | මැලේසියාවේ විශේෂ නියෝජිත සාමි වේලු මැතිතුමා ( Mr. Samy Vellu) |
| 23 | 2015.05.27 | ෆීජි හි අග්‍රවිනිශ්චයකාර ඇන්තනී ගේට්ස් මැතිතුමා (Mr. Anthony Gates) |
| 24 | 2015.05.27 | මධු කන්නන් මහතාගේ නායකත්වයෙන් යුත් ටාටා සමූහ සමාගමේ විධායක නියෝජිතයින් (Mr. Madhu Kannan) |
| 25 | 2015.06.04 | ජර්මනියේ විශේෂ නියෝජිත ඩැග්මාර් වර්ල් මහත්මිය (Mrs. Dagmar Wohrl) |
| 26 | 2015.06.08 | පකිස්ථානයේ යුද්ධ හමුදා කාර්ය මණ්ඩල ප්‍රධානි ජනරාල් රහීල් ෂෙරීෆ් (Gen Rahil Sheriff) |
| 27 | 2015.06.11 | යුනෙස්කෝ සංවිධානයේ පරිසර හිතකාමී කාර්මික සංගමයේ ආරම්භක සභාපති මහාචාර්ය එම්. එස්. ස්වාමිනාදන් මහතා ( Prof. M S Swaminathan) |
| 28 | 2015.06.26 | ඉන්දියාවේ හිටපු ජනාධිපති ගරු ආචාර්ය අබ්දුල් කලාම් මැතිතුමා (Hon. Dr. Abdul Kalam) |
| 29 | 2015.07.21 | යුරෝපා කොමිසමේ මැතිවරණ නිරීක්ෂක ප්‍රධානි ක්‍රිස්ටියන් ප්‍රීඩා මහතා (Mr. Christian Preda) |
| 30 | 2015.08.12 | ඉන්දියාවේ GVK කණ්ඩායම |
| 31 | 2015.08.15 | යුරෝපා පාර්ලිමේන්තු කණ්ඩායම |
| 32 | 2015.08.24 | බ්‍රිතාන්‍ය හිටපු ආග්‍රාමාත්‍ය ගරු ටෝනි බ්ලෙයාර් මහතා (Hon. Tony Blair) |
| 33 | 2015.08.25 | ඇමරිකානු සහකාර රාජ්‍ය ලේකම්, නිෂා බිස්වාල් මෙනවිය (Ms. Nisha Biswal) |
| 34 | 2015.09.01 | ඇෆ්ගනිස්ථානයේ හිටපු ජනාධිපති ගරු හමීඩ් කර්සායි මැතිතුමා (Hon. Hamid Karzai) |
| 35 | 2015.09.04 | දකුණු අප්‍රිකාවේ ජනාධිපති ගරු ජාකොබ් සුමා මැතිතුමා (Hon. Jacob Zuma) |
| 36 | 2015.09.18 | ලෝක බැංකුවේ දකුණු ආසියානු කලාපීය උප සභාපතිනී, ඇනට් ඩික්සන් මෙනවිය (Ms. Annette Dixon) |

| අංක | දිනය | මුණගැසුණු රාජ්‍ය තාන්ත්‍රිකයින් |
|---|---|---|
| 37 | 2015.09.08 | ඇමරිකා එක්සත් ජනපදයේ හිටපු නියෝජ්‍ය ලේකම් හා ආර්මිටේජ් ජාත්‍යන්තර සංවිධානයේ සභාපති රිචඩ් ආමිටේජ් මහතා (Mr. Richard Armitage) |
| 38 | 2015.09.22 | ජර්මනියේ විදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය ගරු ෆ්‍රැන්ක් වෝල්ටර් ස්ටැන්මියර් මැතිතුමා (Hon.Frank Walter Steinmeier) |
| 39 | 2015.10.09 | චීන රජයේ විශේෂ නියෝජිත ලියු ෂෙන්මින් මැතිතුමා (Mr. Liu Zhenmin) හා චීන විදේශ කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා |
| 40 | 2015.10.21 | මානව හිමිකම් රැකවල් පිළිබඳ ආසියානු කලාපීය අධ්‍යක්ෂක බ්‍රැඩ් ඇඩම්ස් මැතිතුමා සහ නීති ප්‍රතිපත්ති අධ්‍යක්ෂ ගරු ජේම්ස් රෝස් මැතිතුමා ( Mr. Brad Adams and Hon. James Ross)<br><br>හිටපු කාම්බෝජියානු අතිවිශේෂ අධිකරණ විනිසුරු සහ ජපාන ශ්‍රේෂ්ඨාධිකරණ ප්‍රධාන නීති නියෝජිත මොටෝ නුගුචි මැතිතුමා (Mr. Moto Nuguchi) |
| 41 | 2015.10.22 | එක්සත් ජාතීන්ගේ දේශපාලන කටයුතු දෙපාර්තමේන්තුවේ සහකාර මහ ලේකම් මිරෝස්ලව් ජෙන්කා මැතිතුමා (Mr. Miroslav Jenca) |
| 42 | 2015.10.23 | මැලේසියානු විශේෂ නියෝජිත දතෝ සාමි වේලු මැතිතුමා (Mr. Dato Sami Vellu) |
| 43 | 2015.11.02 | නවසීලන්ත, ඕක්ලන්ඩ් හි ප්‍රාදේශීය පහසුකම් පිළිබඳ සභාපති ශ්‍රීමත් දොන් මැකිනන් මහතා (Sir Don McKinnon ) |
| 44 | 2015.11.10 | පාකිස්තානු ෆෙඩරල් රජයේ වාණිජ අමාත්‍ය ගරු කුරාම් ඩැස්ටිගිර් ඛාන් මැතිතුමා (Hon. Khurram Dastigir Khan)<br><br>ඇමරිකා එක්සත් ජනපදයේ සම්මේලන සාමාජික ජිම් සෙන්සෙන්බ්‍රිනර් මැතිතුමා සහ දූත පිරිස (Mr. Jim Sensenbrenner) |
| 45 | 2015.11.16 | ජිනීවා හි IOM මුලස්ථානයේ සංක්‍රමණ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෝරන්ස් හාර්ට් මැතිතුමා (Mr. Laurence Hart)<br><br>බලහත්කාරයෙන් හෝ අකමැත්තෙන් අතුරුදහන් වූවන් පිළිබඳ කාර්ය කණ්ඩායම (WGEID) |
| 46 | 2015.11.17 | මුහුදු හා ධීවර කටයුතු පිළිබඳ ප්‍රධාන උපදේශක සේසර් ඩේබන් මැතිතුමා හා දූත මණ්ඩලය ( Mr. Cesar Deben) |
| 47 | 2015.11.23 | එක්සත් ජනපදයේ, එක්සත් ජාතීන්ගේ නිත්‍ය නියෝජිත ගරු සමන්තා පවර් මැතිනිය (Hon. Samantha Power) |
| 48 | 2015.11.30 | එක්සත් ජනපදයේ ආයෝජක ජෝජ් සෝරෝස් මැතිතුමා හා දූත පිරිස (Mr. George Soros)<br><br>ඉන්දියානු යුධහමුදා කාර්ය මණ්ඩල ප්‍රධානී ජෙනරාල් දල්බීර් සිං මැතිතුමා (Gen. Dalbir Singh) |
| 49 | 2015.12.16 | එක්සත් ජනපදයේ දේශපාලන කටයුතු ලේකම්, තානාපති තෝමස් ෂැනෝන් මැතිතුමා ( H.E. Thomas Shannon) |

## 3. ප්‍රතිපත්ති සම්පාදන හා ආර්ථික සංවර්ධන කටයුතු

වර්තමාන රජයේ ආර්ථික වැඩ පිළිවෙලට පාදක වන්නේ දැනුම මත පදනම් වූ තරඟකාරී සමාජ වෙළඳපොළ ආර්ථිකයයි. ඒ මත පදනම් ව ආර්ථිකය සංවර්ධනය කිරීමේ ක්‍රියාවලියේ දී යෝග්‍ය ප්‍රතිපත්ති හා තීරණ නිර්ණය කිරීම හා ඒවා ක්‍රියාවට නැංවීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන තිබේ.

### 3. 1 ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව

ආර්ථික කළමනාකරණය හා ආශ්‍රිත කරුණු සම්බන්ධයෙන් යෝග්‍ය නිර්දේශයන් ඉදිරිපත් කිරීම සඳහා 2015.09.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව ස්ථාපිත කරන ලද අතර, කමිටුවේ කාර්ය භාරය පහත දැක්වෙන පරිදි වේ.

i. ආර්ථික කටයුතු, මුදල් ප්‍රතිපත්ති සහ මූල්‍ය කටයුතු වලට අදාල අමාත්‍ය මණ්ඩල සංදේශ අධ්‍යයනය කොට අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

ii. ජාතික ආයෝජන වැඩ සටහන හා පොදු ආයෝජන වැඩ සටහන සම්පාදනයෙහි සහ පෞද්ගලික අංශ ආයෝජන පහසුකරවීමෙහි ලා උපදෙස් ලබා දීම;

iii. ආර්ථික හා මූල්‍යමය ව්‍යාකූලතා සහිත යෝජනා සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම; සහ

iv. රටෙහි ආයෝජන/ආර්ථික සංවර්ධනය කෙරෙහි ඍජු සම්බන්ධතාවයක් සහිත විවිධ නීති පද්ධති ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම.

**කමිටු සංයුතිය**

| | | |
|---|---|---|
| 1. | රනිල් වික්‍රමසිංහ මහතා | අග්‍රාමාත්‍ය (සභාපති) |
| 2. | ගරු නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා | ප්‍රවාහන අමාත්‍ය |
| 3. | ගරු රවුෆ් හකීම් මැතිතුමා | නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය |
| 4. | ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා | ආපදා කළමනාකරණ අමාත්‍ය |
| 5. | ගරු රවී කරුණානායක මැතිතුමා | මුදල් අමාත්‍ය |
| 6. | ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය |
| 7. | ගරු කබීර් හෂීම් මැතිතුමා | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය |
| 8. | ගරු අර්ජුන රණතුංග මැතිතුමා | වරාය හා නාවික කටයුතු අමාත්‍ය |
| 9. | ගරු සාගල රත්නායක මැතිතුමා | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍ය |
| 10 | ගරු මලික් සමරවික්‍රම මැතිතුමා | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍ය |
| 11 | ගරු (ආචාර්ය) සරත් අමුණුගම මැතිතුමා | විශේෂ කාර්යයන් පිළිබඳ අමාත්‍ය |

කමිටුවේ ලේකම් ලෙස අග්‍රාමාත්‍ය ලේකම් කටයුතු කරයි. 2015 දෙසැම්බර් මස 31 වන දින වනවිට කමිටු රැස්වීම් වාර එකොළහක්(11) පවත්වා ඇති අතර, එක් එක් අංශය සම්බන්ධයෙන් ගන්නා ලද තීරණ / නිකුත් කරන ලද ප්‍රතිපත්තිමය මග පෙන්වීම් වල සාරාංශයක් පහත දැක්වේ.

| අංශය/අදාල අමාත්‍යාංශය | ගන්නා ලද තීරණය/නිකුත් කරන ලද ප්‍රතිපත්තිමය මග පෙන්වීම |
|---|---|
| **කම්කරු සහ වෘත්තීය සමිති සබඳතා** | යෝජිත පෞද්ගලික අංශ වැටුප් වැඩිවීම ක්‍රියාත්මක කිරීම සඳහා නීති සම්පාදනය කිරීම |
| | වැටුප් වැඩිවීම, ශ්‍රම බලකායේ ඵලදායිතා වර්ධනය හා නම්‍යතාවය හා සමග යා කිරීමේ ක්‍රම හා විධි විමසා බැලීම |
| | වැටුප් හා වේතන මණ්ඩල රැස්වීම් සඳහා ගෙවීම් වැඩිකිරීම සඳහා වැටුප් මණ්ඩල ආඥාපනත සංශෝධනය කිරීම පිණිස පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම |
| | ශ්‍රමිකයින්ගේ අයවැය සහන දීමනා පනත් කෙටුම්පත අනුමත කිරීම අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කිරීම |
| | |
| **මුදල්** | ග්‍රාම නිලධාරි මට්ටමේ විවිධ කාණ්ඩ සඳහා ලබා දෙන සුභසාධන ප්‍රතිලාභ සමාලෝචනය කිරීම |
| | හිඟය මැඩපවත්වාලීම සඳහා මාස හතරක ඉරිඟු අවශ්‍යතා ආනයනය කිරීම |
| | 2016 අයවැයෙහි යෝජිත සංචාරක සංවර්ධන ගාස්තුව අවලංගු කිරීම සහ වෙනත් නාමයක් යටතේ වෙනම මාදිලියක් භාවිතා කරමින් එකී ගාස්තුව එක්රැස් කිරීමට සහ සංචාරක ප්‍රවර්ධනය සඳහා පමණක් වන, වෙනම අරමුදලක් මහ භාණ්ඩාගාරය යටතේ ස්ථාපිත කිරීම |
| | පාසල් නිලඇඳුම් වවුචර ක්‍රමය යටතේ එක්වර මුදල් ගෙවීම සඳහා අරමුදල් සැපයීම |
| | කාබනික පොහොර භාවිතය දිරිමත් කිරීම සඳහා පොහොර සඳහා යෝජිත සහනාධාර මුදල් ගෙවීම්වලින් යටත් පිරිසෙයින් සියයට 10% ක් මිශ්‍ර පොහොර බඳුන් සඳහා ලබා දීම |
| | ණය කළමනාකරණ කාර්ය සාධන ඇගයීම මත වාර්තා කිරීම සඳහා ලෝක බැංකුව විසින් යෝජිත පරිදි ණය කළමනාකරණ ක්‍රියාකාරකම් සඳහා වෙනම කාර්යාලයක් ස්ථාපිත කිරීම |
| | වී අලෙවි මණ්ඩලය විසින් ලංකා බැංකුවට සහ මහජන බැංකුවට ගෙවිය යුතුව ඇති මුදල්, ප්‍රමුඛත්ව පදනමින්, වී අලෙවියෙන් ලත් මුදල්වලින් සමථයට පත් කිරීම |
| | 2016 අයවැය සහ ආදායම් එක්රැස්කිරීමේ ක්‍රමවේදය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය මග පෙන්වීම් ලබා දීම |
| | |
| **ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා** | සේවක අර්ථසාධක අරමුදල්ට ගෙවීමට ඇති ණය හිලව් කිරීම සඳහා ශ්‍රීලංගම ඉඩම් පවරා දීම |
| | ශ්‍රීලංගමයට තවදුරටත් සේවකයින් බඳවාගැනීම අත්හිටුවීමට සහ මුදල් අමාත්‍යාංශය විසින් යෝජිත පරිදි ප්‍රශස්ථ සේවක සංඛ්‍යා මට්ටමකට අනුගත වීම |

| අංශය/අදාල අමාත්‍යාංශය | ගන්නා ලද තීරණය/නිකුත් කරන ලද ප්‍රතිපත්තිමය මග පෙන්වීම |
|---|---|
| ප්‍රවාහන සහ සිවිල් ගුවන් සේවා | ශ්‍රී ලංගම ඩිපෝ වැඩි වැඩියෙන් ආදායම් එක්රැස් කිරීම කෙරෙහි නැඹුරු කරවීම සඳහා සැලසුම් සම්පාදනය කිරීම |
| | මහජනතාවට විශිෂ්ට සේවය ලබා දීම සඳහා දුම්රිය සේවා කළමනාකරණය ප්‍රතිව්‍යුහගත කිරීම |
| | ශ්‍රීලංගම සඳහා ප්‍රතිව්‍යුවගත කිරීමේ සැලසුමක් සම්පාදනය කිරීමට හා ක්‍රියාත්මක කිරීම |
| | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි දෙවන ධාවන පථය ඉදිකිරීම සඳහා ඉදිරිපත්ව ඇති විකල්පයන් දෙක, තාක්ෂණික විශේෂඥ කණ්ඩායමක් විසින් අධ්‍යයනය කිරීමට සැලැස්වීම |
| | මත්තල දක්වා ගුවන් ගමන් මෙහෙයුම්වලට අදාල ගිවිසුමේ සලසන ලද සහන ඉවත් කර ගැනීමට යටත්ව මත්තල හා සම්බන්ධතාවය අත්හැර දැමීම සඳහා ෆ්ලයිඩුබායි ආයතනයට අවසර දීම |
| | කොළඹට හෝ කළුතරට සමීප ප්‍රදේශයක රත්මලාන ගුවන් තොටුපළ ප්‍රතිස්ථාපිත කිරීම |
| | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි දැනට ඇති ධාවන පථයේ පෘෂ්ඨ ඇතිරීම් සම්බන්ධයෙන් සහ දෙවන ධාවන පථය ස්ථානගත කිරීම සම්බන්ධයෙන් දෙන ලද ප්‍රතිපත්තිමය නියෝග |
| | මුල්‍යමය වශයෙන් ලාභදායී ව්‍යාපාරයක් බවට පත් කිරීම සඳහා ශ්‍රීලංගමය ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධයෙන් දෙන ලද ප්‍රතිපත්තිමය නියෝග |
| | ප්‍රමාදයන් අවම කිරීම පිණිස, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළෙහි ඉන්ධන ජලෝද්ගම නළක්‍රමය සඳහා, අරමුදල් යෙදවීම සහිතව හෝ රහිතව යන විකල්ප දෙකම ඇතුළත් මිලගණන් සහිතව සකස් වූ ටෙන්ඩර් කැඳවීම |
| | පහත දැක්වෙන ගුවන්තොටුපළවල් ස්වාධීන ලාභ ලැබීමේ මධ්‍යස්ථාන බවට පරිවර්තනය කිරීම<br>- කටුනායක ගුවන්තොටුපළ<br>- මත්තල ගුවන්තොටුපළ |
| | පහත දැක්වෙන ක්‍රියාදාමයන්ට යටත්ව, දුම්රිය මාර්ග සඳහා අවශ්‍ය යන්ත්‍ර හා මැදිරි ආදිය මිලදී ගැනීම සඳහා ඉන්දියානු ණය භාවිතා කිරීම සහ දුම්රිය මාර්ග පුනරුත්ථාපනය කිරීම<br>- දැඩි තත්ත්ව ඇගයීම<br>-ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය විසින් නිකුත් කර ඇති ප්‍රසම්පාදන උපදෙස් මාලා අනුගමනය කිරීම |
| | |
| ආපදා කළමනාකරණ | පිටාර ජලය ගලායෑම කුඩා බෝක්කුවලින් බාධා ඇති වන්නේද යන වග පරික්ෂා කර බැලීම සඳහා කුඩා ගුවන් යානා භාවිතා කරමින්, ගංවතුර බැසයාමේ ක්‍රියාවලිය සම්බන්ධයෙන් සමීක්ෂණයක් කිරීම |
| | ප්‍රතිලාභීන් කවරහුද යන්න දැන ගැනීම සඳහා ආපදා සහනාධාර ලබන පවුල්වල දත්තයන් ප්‍රකාශයට පත් කිරීම |
| | ආපදා කළමනාකරණය සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ඉදිරිපත් කර ඇති සංයුක්ත සැලැස්ම අනුමත කිරීම |

| අංශය/අදාල අමාත්‍යාංශය | ගන්නා ලද තීරණය/නිකුත් කරන ලද ප්‍රතිපත්තිමය මග පෙන්වීම |
|---|---|
| වැවිලි කර්මාන්ත | තේ නිෂ්පාදන නව ජාත්‍යන්තර වෙළඳපළට පැමිණවීම සඳහා සැලසුමක් සම්පාදනය කිරීම |
| | ඵලදායිත්වය වැඩි කරමින්, තේ අංශයෙහි නිෂ්පාදන පිරිවැය පහත හෙලීම සඳහා සැලසුමක් සම්පාදනය කිරීම |
| | රබර් අංශයේ සංවර්ධනය සඳහා කාලය පදනම් කර ගත් සවිස්තරාත්මක හා ක්‍රියාත්මක කළහැකි ක්‍රියාකාරී සැලැස්මක් සම්පාදනය කිරීම |
| | අවශ්‍ය පාරිසරික නිෂ්කාෂණ මත පදනම්ව, වගා කෙරෙන වපසරියේ කිසියම් සීමාවක් පැනවීම රහිතව මහවැලි ව්‍යාපාර ප්‍රදේශවල කටුපොල් වගාව ව්‍යාප්ති කරලීම |
| | 2015 දීපාවලී සැමරුම සඳහා වැවිලි කර්මාන්ත සේවකයින්ට ලබා දෙන ලද උත්සව අත්තිකාරම ණයක් ලෙස සළකා කටයුතු කිරීම සඳහා ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට ණයක් ප්‍රදානය කිරීම මගින් තේ මණ්ඩලයට සිදුවී ඇති පොලී හානිය මහ භාණ්ඩාගාරය විසින් දරා ගැනීම |
| | අධ්‍යයනයක් කර, රබර් කර්මාන්තයේ ඉදිරි වසර තුන සඳහා වාර්තාවක් සකස් කිරීම |
| | කොකෝවා සඳහා වර්ධනය වෙමින් පවත්නා ඉල්ලුම සැපයීම සඳහා කොකෝවා වගා කිරීම සඳහා සුදුසු ඉඩම් හඳුනාගැනීම |
| | මහවැලි ඉඩම් හැර, ප්‍රාදේශීය වැවිලි සමාගම්වලින් පාලනය කෙරෙන ඉඩම් ඇතුළු වෙනත් ඉඩම්වලට කටු පොල් වගාව ව්‍යාප්ත කරලීම |
| | රබර් අංශයේ ගැටළු සම්බන්ධයෙන් පියවර ගැනීම සඳහා කමිටුවක් පත් කිරීම |
| | වැවිලි අංශය සඳහා සහනාධාර සැලසීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය මග පෙන්වීම් ලබාදීම |
| | |
| නගර සැලසුම් හා ජල සම්පාදන | හලාවත-පුත්තලම සහ මහරගම-බොරලැස්ගමුව කැළිකසළ බැහැරකිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම |
| | එකී ව්‍යාපෘති භාවිතා කිරීම වැඩි කිරීම සඳහා ව්‍යාපාරික මොඩියුලයක් නිර්මාණය කිරීම |
| | අනාගතයේදී ක්‍රියාත්මක කිරීම සඳහා කැළිකසළ කාණු ව්‍යාපෘති ප්‍රමුඛත්වයෙහි ලා සැලකීම සහ බස්නාහිර පළාතෙහි එවන් ව්‍යාපෘති ඇති කිරීම සඳහා මහා නගර ව්‍යාපෘතිය හා සමග සහසම්බන්ධතාවයෙන් කටයුතු කිරීම |

| අංශය/අදාල අමාත්‍යාංශය | ගන්නා ලද තීරණය/නිකුත් කරන ලද ප්‍රතිපත්තිමය මග පෙන්වීම |
|---|---|
| **නගර සැලසුම් හා ජල සම්පාදන** | අ) ඉමදූව ජල සම්පාදන ව්‍යාපෘතිය, ජල සම්පාදන ව්‍යාපෘති සමාලෝචන කමිටුවට ඉදිරිපත් කිරීම<br><br>ආ) දෙනියාය, අඟුණකොළපැලැස්ස, ඌරුබොක්ක, ගලෙන්බිඳුණුවැව, හතරලියැද්ද, මොරවක සහ මුරුතවෙල බරවකුඹුර ජල සම්පාදන ව්‍යාපෘති සම්බන්ධයෙන් යෝජනා සඳහා ආරාධනා (RFP) කැඳවීමට සහ මුල්‍ය හා වෙනත් ව්‍යාපෘති විස්තර සමාලෝචන කමිටුවට ඉදිරිපත් කිරීම |
| | සිය කැමැත්තෙන් සහනදායි අරමුදල් යෙදවීම් සහිතව දැනටමත් ලැබීමට නියමිතව ඇති, ජල සම්පාදන ව්‍යාපෘතිවල වඩාත් හොඳ විශ්වසනීයත්වය සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල ප්‍රතිපත්තිමය නියෝග |
| | |
| **උසස් අධ්‍යාපන හා මහාමාර්ග** | සමුද්‍රීය මාර්ගය දෙහිවල දක්වා දීර්ඝ කිරීම |
| | රාජගිරිය හා බත්තරමුල්ල ප්‍රදේශවල රථවාහන තදබදය විසඳාලීමට ගුවන් පාලම් ව්‍යාපෘති ආරම්භ කිරීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුවෙන් නෛතික නිෂ්කාෂණය ලබා ගැනීම කඩිනම් කිරීම |
| | මධ්‍යම අධිවේගී මාර්ග ව්‍යාපෘතියේ ප්‍රගතිය සමාලෝචනය කිරීමට සහ අවශ්‍ය වන පරිදි ප්‍රතිපත්තිමය නියෝග ලබාදීම |
| | ශ්‍රී ජයවර්ධනපුර සහ කැළණිය විශ්ව විද්‍යාලවල වෘත්තීය පුහුණු සහ ඉංජිනේරු පීඨ ස්ථාපිත කිරීම |
| | |
| **වරාය හා නාවික** | නැගෙනහිර බහාලුම් පර්යන්ත ව්‍යාපෘතියේ ටෙන්ඩර් ක්‍රියාපරිපාටිය කඩිනම් කිරීම |
| | හම්බන්තොට අදියර 2 ඉදිකිරීම්වල උපකරණ මිල ගණන් සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු සමග යළිත් ප්‍රමන්ත්‍රණයෙහි යෙදීම |
| | හම්බන්තොට වරාය සහ මත්තල ගුවන් තොටුපළ ලාභදායී වාණිජ මෙහෙයුම් ලෙස ක්‍රියාත්මක කරලීම සඳහා ඒකාබද්ධ යාන්ත්‍රණයක් හඳුනා ගැනීම |
| | ශ්‍රී ලංකාව කලාපයේ ලාභදායී ගුවන්-සමුද්‍රීය කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම සඳහා කමිටුවක් පත් කර සංයුක්ත සැලැස්මක් සැකසීම |
| | හම්බන්තොට වරාය හා ත්‍රිකුණාමල වරාය පරිශ්‍රයන්හි ආයෝජන සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය නියෝග |
| | වරාය නගර ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය නියෝග |
| | පහත දැක්වෙන වරාය ස්වාධීන ලාභ උපයන මධ්‍යස්ථාන ලෙස පරිවර්තනය කිරීම<br>- හම්බන්තොට වරාය<br>- ත්‍රිකුණාමලය වරාය<br>- ගාලු වරාය<br>- කොළඹ- දකුණ වරාය, සීමාසහිත සවුත් ඒසියා ගේට්වේ ටර්මිනල් පෞද්ගලික සමාගම, ජායා බහාළුම් පර්යන්තය, නැගෙනහිර වරාය |

| අංශය/අදාල අමාත්‍යාංශය | ගන්නා ලද තීරණය/නිකුත් කරන ලද ප්‍රතිපත්තිමය මග පෙන්වීම |
|---|---|
| **සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ** | අග්‍රාමාත්‍යතුමාගේ ඉන්දියා හා ජපන් සංචාරවලදී ගන්නා ලද තීරණයන් ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීම |
| | ෂන්ග්‍රිලා සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය සඳහා විදුලිබල සැපයුම ස්ථාපිත කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට ඉඩම් කොටසක් වෙන් කර දීම |
| | ආයෝජනයන් කඩිනම් කිරීමට සහ අපනයන ප්‍රවර්ධනය සඳහා ක්‍රියාදාම ලැයිස්තුවක් අනුමත කිරීම |
| | කර්මාන්ත උද්‍යාන ලෙස සංවර්ධනය කිරීම සඳහා කුලියාපිටියේ හා ප්‍රත්‍යන්තර ප්‍රදේශවල ඉඩම් හඳුනා ගැනීම |
| | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය යටතේ ඕනෑම ආකාරයක පාරසමුද්‍ර ප්‍රවර්ධන ක්‍රියාදාමයන්ට එකඟවීම සහ ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවේදී පාරසමුද්‍ර ප්‍රවර්ධන ක්‍රියාදාමයන් අනුමත කිරීම |
| | හම්බන්තොට ඛණිජතෙල් පිරිපහදුවක් සහ ජෛව-ඉන්ධන මිශ්‍රකිරීමේ ව්‍යාපෘතියක් සඳහා ප්‍රතිපත්තියක් වශයෙන් අනුමැතිය ලබා දීම |
| | ආයෝජන ප්‍රවර්ධනය සම්බන්ධයෙන්, ටෝනි බ්ලෙයාර් ඇසෝසියේට්ස් ආයතනයෙන් උපදේශක සේවා ලබා ගැනීම |
| | වාලච්චේන කඩදාසි කර්මාන්තශාලා පරිශ්‍රයෙහි ඇති ඉඩම් ගොල්ෆ් ක්‍රීඩා භූමියක් සඳහා භාවිතා කිරීම සම්බන්ධයෙන් අධ්‍යයනය කර වාර්තා කිරීමට සහ මඩකලපුවේ සහ කල්මුණේ ප්‍රදේශවල තරුණ පිරිස් සඳහා රැකියා උත්පාදනය කළ හැකි තොරතුරු තාක්ෂණ කර්මාන්ත උද්‍යානයක් ස්ථාපිත කිරීමට ආයෝජන මණ්ඩලයට උපදෙස් දීම |
| | සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තරවෙළඳ අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීමට යෝජිත සංවර්ධන නියෝජිතායතනය සහ ජාත්‍යන්තර වෙළඳ නියෝජිතායතනය සඳහා පොදු කටයුතු කමිටු අනුමත කිරීම |
| | |
| **විදේශ කටයුතු** | ස්ථිර කිරීම සඳහා කටයුතු කිරීමට ඇති ද්විපාර්ශ්වීය ගිවිසුම් පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට සහ පාර්ලිමේන්තු අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව අවශ්‍ය වෙතොත් යළි ප්‍රමන්ත්‍රණයෙහි යෙදීම |
| | ජී.එස්.පී.+ සහනය ලබා ගැනීමට අදාල ප්‍රගතිය සමාලෝචනය කිරීම<br>ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත - පවත්නා යල් පැන ඇති නීති වෙනුවට නව නීති සම්පාදනය |
| | |
| **තිරසාර සංවර්ධනය හා වනජීවී** | දැරණියගල, නයාගඟ සුළු පරිමාණයේ ජල විදුලිබලාගාරයට අදාල පාරිසරික ගැටළු තවදුරටත් අධ්‍යයනය කිරීමට සහ යෝග්‍ය විසඳුමක් යෝජනා කිරීම |

| අංශය/අදාල අමාත්‍යාංශය | ගන්නා ලද තීරණය/නිකුත් කරන ලද ප්‍රතිපත්තිමය මග පෙන්වීම |
|---|---|
| ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු | උතුරු, නැගෙනහිර සහ ඌව පළාත් සඳහා අරමුදල් සහාය ලබා ගැනීම සඳහා ප්‍රදායකයින්ගේ සම්මන්ත්‍රණයක් සැලසුම් කිරීම |
| | රාජගිරියේ ගෝල්ඩන් කී අක්ෂි හා ක.නා.උ.ආරෝග්‍යශාලාව විකිණීම |
| | විමධ්‍යගත අයවැය මුදල් භාවිතා කරමින් පළාත් සහා මාර්ග අළුත්වැඩියා කිරීම |
| | යෝජිත 2016-2020 පොදු ආයෝජන වැඩ සටහන සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය නියෝග |
| | යටිතලපහසුකම් සංවර්ධනය කඩිනම් කිරීම සඳහා වෙනත් සම්ප්‍රදායික ක්‍රමවේදයන් හා සමග පොදු ප්‍රසම්පාදනයේ ස්විස් අභියෝග ක්‍රමවේදයද ශ්‍රී ලංකාවෙහි අනුගමනය කිරීම |
| | රජය සතු ව්‍යාපාරවල බැංකු කටයුතු බාධාවකින් තොරව ඉටු කර ගැනීම තහවුරු කරලීම සඳහා, බැංකු සේවාවන් ලබා ගැනීම සඳහා යෝග්‍යයැයි තමන් සළකනු ලබන, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමතකර ඇති ඕනෑම බැංකුවක් තෝරා ගැනීමට රජය සතු ව්‍යාපාරවලට අවසරය දීම |
| | |
| රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන | ශ්‍රී ලංකා ගුවන් සේවය ප්‍රතිස්ථාපනය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය නියෝග |
| | ඌණ කාර්ය සාධනයෙන් යුත් සහ / හෝ හිමිකරුවන් විසින් අත්හැර දමා ඇති ව්‍යාපාර අත්පත් කර ගැනීම සඳහා නීති පැනවීම අධ්‍යයනය කිරීම සහ සමාලෝචන කමිටුවක් පත් කිරීම ( ඌණ කාර්ය සාධන ව්‍යාපාර පනත) |
| | ජනවසම/ශ්‍රීලංරාවැසං/ඇල්කඩුව ප්ලාන්ටේෂන්ස් යන ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා යෝජනා කර ඇති ප්‍රතිව්‍යුහ ක්‍රියාදාමය ප්‍රතිපත්තිමය වශයෙන් අනුමත කිරීම |
| | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කිරීමට නියමිත වැවිලි ප්‍රතිව්‍යුහ ඒකකය මෙහෙයවීම සඳහා මෙහෙයුම් කමිටුවක් පත් කිරීම |
| | වොක්ෂෝල් වීදියේ අංක: 175 දරණ ස්ථානයෙහි සහ නාවලපිටිය බෝහිල් වතුයායේ ඉඩම්වලට අදාල ගැටළු සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය මග පෙන්වීම ලබා දීම |
| | රාජ්‍ය ව්‍යවසාය මණ්ඩලය පත් කිරීම අනුමත කිරීම |
| | |
| මහානගර සහ බස්නාහිර සංවර්ධනය | කැළිකසළ බැහැර කිරීමේ යෝජනා විග්‍රහය සඳහා අයිඑෆ්සී ආයතනය සම්බන්ධකර ගැනීම සහ ඔවුන්ට ඇ.එ.ඩො. 400,000 ක අත්තිකාරමක් ගෙවීම |
| | කැළිකසළ බැහැර කිරීමේ යන්ත්‍රාගාරය ස්ථාපිත කිරීම සඳහා වෙස්ටර්න් පවර් කම්පැණි ලිමිටඩ් සමාගමට ඉඩමක් වෙන් කර දීම |

| අංශය/අදාල අමාත්‍යාංශය | ගන්නා ලද තීරණය/නිකුත් කරන ලද ප්‍රතිපත්තිමය මග පෙන්වීම |
|---|---|
| **මහානගර සහ බස්නාහිර සංවර්ධනය** | මහානගර ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය නියෝග |
| | මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් සම්පාදනය කර ඇති ප්‍රවාහන අංශ ප්‍රධාන සැලැස්ම සඳහා ප්‍රතිපත්තිමය වශයෙන් අනුමැතිය ලබා දීම |
| | කොළඹ නගරයේ ඒකාබද්ධ ප්‍රවාහන සංවර්ධන සැලස්ම සඳහා අන්තර්-නියෝජිතායතන කාර්ය සාධන බලකායක් ස්ථාපිත කිරීම |
| | කැළිකසළ බැහැර කිරීමේ ව්‍යාපෘති තෝරා ගැනීම සඳහා අයිඑෆ්සී ආයතනය සම්බන්ධ කර ගැනීමේ මුල් තීරණය අවලංගු කිරීමට සහ මහානගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය විසින් යෝජනා කරනු ලබන දේශීය විශේෂඥයින්ගේ සහාය ඇතිව යෝග්‍ය කැළිකසළ බැහැර කිරීමේ ව්‍යාපෘති තෝරා ගැනීම සඳහා ලේකම් කමිටුවක් පත් කිරීම |
| | |
| **ඛණිජ තෙල් සම්පත් සංවර්ධන** | බිටුමන් තාර සඳහා බන්ධිත ගුදම් ස්ථාපිත කිරීම අනුමත කිරීම අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කිරීම |
| | බිටුමන් තාර දේශීය වෙළඳපොළට විකිණීම අනුමත කිරීම අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කිරීම |
| | ඛණිජ තෙල් සම්පත් සංවර්ධන මහ ලේකම් කාර්යාලයට රුපියල් මිලියන 256.15 ක සමස්ත ප්‍රතිපාදනයක් අනුමත කිරීම |
| | |
| **අධිකරණ** | කොළඹ, නව උසාවි සහ කාර්යාල සංකීර්ණය ඉදි කිරීම සඳහා සීමාසහිත බී.සී.සී. ලංකා සමාගමට අයත් අක්කර 4 ක භූමි භාගය අත්පත් කර ගැනීම |
| | නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතුව, මෙතෙක් ලබා දී නොමැති නීති උපදෙස් ලබා ගැනීම කඩිනම් කිරීමට උපදෙස් දීම |
| | |
| **ධීවර සහ ජලජ සම්පත්** | යුරෝපා සංගම් ධීවර තහනම සම්බන්ධයෙන්, ධීවර පනතට අවශ්‍ය සංශෝධයන්ට අදාල කටයුතු කඩිනමින් නිම කිරීම |
| | යුරෝපා සංගම් ධීවර තහනමට අදාල මෙහෙයුම් කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා උපාධිධාරීන් 80 දෙනෙකු සෘජුව ධීවර අමාත්‍යාංශයට බඳවා ගැනීම |
| | |
| **විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම්** | භෞමික රූපවාහිනී නාලිකා ඩිජිටල්කරණය කිරීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය නියෝග |
| | මොබිටෙල් ආයතනය විසින් හච් ආයතනය අත්පත් කර ගැනීමේ යෝජනාව සම්බන්ධයෙන් ප්‍රසම්පාදන කමිටුවක් හා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත් කිරීම |

| අංශය/අදාල අමාත්‍යාංශය | ගන්නා ලද තීරණය/නිකුත් කරන ලද ප්‍රතිපත්තිමය මග පෙන්වීම |
|---|---|
| **පරිසර** | විදේශීය සමාගමක බලය ලත් සමාගමක් බවට සනාථ කළ හැකි නම්, දේශීය මැණික් සමාගම් කිහිපයකට දී ඇති බලපත්‍ර අවලංගු කිරීම |
| | මැණික් කර්මාන්තය විසින් මුහුණ පා ඇති ගැටළුවලට විසඳුම් නිර්දේශ කිරීම සඳහා කමිටුවක් පත් කිරීම |
| | |
| **ස්වදේශ කටයුතු** | මාර්ග සංවර්ධන අධිකාරියේ මාර්ග හැර, ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ ඇති මාර්ග ව්‍යාපෘති සහ පළාත් පාලන බලාධිකාරි විසින් ආරම්භ කරන ලද ව්‍යාපෘතිද කඩිනම් කිරීම |
| | සම්පූර්ණ නොකරන ලද පළාත් ව්‍යාපෘති සඳහා අධීක්ෂණ හා මෙහෙයුම් අධිකාරි ලෙස කටයුතු කිරීමට සහ කටයුතු කඩිනම් කිරීම සහ ගෙවීම් සහතික කිරීමට දිස්ත්‍රික් ලේකම්වරුන්ට බලය දීම |
| | |
| **නිවාස හා ඉදිකිරීම්** | බම්බලපිටිය මහල් නිවාස සංවර්ධනයට අදාල කටයුතු කර ගෙන යාම ප්‍රතිපත්තිමය වශයෙන් අනුමත කිරීම |
| | මැදි ආදායම් නිවාස හා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ කඩිනම් වැඩ සටහන අනුමත කිරීම අමාත්‍ය මණ්ඩලයට නිර්දේශ කිරීම |
| | |
| **අධ්‍යාපන** | 2016 වසර සඳහා පාසැල් ශිෂ්‍යයින්ට නිල ඇඳුම් රෙදි නිකුත් කිරීමට අදාල ප්‍රතිපත්තිමය නියෝග ලබා දීම |
| | |
| **සමාජ අභිවෘද්ධි හා සුභසාධන** | වී අලෙවි මණ්ඩලයේ ඇති අතිරික්ත වී තොග භාවිත කරමින් සමෘද්ධිලාභීන්ට සහල් නිකුත් කිරීම සළකා බැලීම |
| | |
| **නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන** | හම්බන්තොට සඳහා එක් සංයුක්ත සංවර්ධන සැලැස්මක් සම්පාදනය කිරීම |
| | |
| **ග්‍රාමීය ආර්ථික කටයුතු** | 2015- මහ කන්නයේදී වී මිලදී ගැනීම මත ප්‍රතිපත්තිමය නියෝග ලබාදීම |
| | ස්වකීය වී තොග, වී අලෙවි මණ්ඩලයට විකිණීම සඳහා වෙබ් අඩවියෙහි ලියාපදිංචි වීමට ගොවීන් උනන්දු කරවීම |
| | 2015- මහ කන්නයේදී වී මිළදී ගැනීම මත ප්‍රතිපත්තිමය නියෝග ලබාදීම |

| අංශය/අදාල අමාත්‍යාංශය | ගන්නා ලද තීරණය/නිකුත් කරන ලද ප්‍රතිපත්තිමය මග පෙන්වීම |
| --- | --- |
| **සංචාරක** | එකඟ වූ පරිදි ප්‍රවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කරන ලද්දේද යන්න සම්බන්ධයෙන් ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන මණ්ඩලය විසින් විධිමත් විගණනයක් කර, 2014 වසරේදී ක්‍රියාත්මක කරන ලද ගෝලීය මහා ප්‍රවර්ධන වැඩ සටහන සඳහා ජාත්‍යන්තර මාධ්‍ය සංවිධානවලට කළ යුතුව ඇති ගෙවීම් සම්බන්ධයෙන් කටයුතු කර ගෙන යාම |
| | |
| **කෘෂිකර්ම** | විවෘත වෙළඳපළ තරඟකාරිත්වයක් නිර්මාණය කරලීම සඳහා පොහොර සැපයීම පෞද්ගලික අංශයට ද විවෘත කරදීම |
| | කෘෂිකාර්මික අංශයෙහි ඵලදායිත්වය නංවාලීම සඳහා තෝරාගත් භෝග පහක්, එනම් අර්තාපල්, බී ලූණු, ඉරිඟු, සෝයා බෝංචි සහ මිරිස් ඉලක්ක කර ගත් වාණිජමය කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන යෝජනාවක් අනුමත කිරීම |

## 3.2 ආර්ථික කළමනාකරණය පිළිබඳ නිලධාරී කමිටුව

ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවට, ආර්ථික කළමනාකරණය සම්බන්ධ කරුණු අධ්‍යයනය කර සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අග්‍රාමාත්‍යවරයා විසින් 2015.10.09 දින සිට ආර්ථික කළමනාකරණය පිළිබඳ නිලධාරී කමිටුව පත් කරන ලදි. ශ්‍රී ලංකාවේ සමස්ථ ආර්ථිකයට ප්‍රතිපත්තිමය මහපෙන්වීම් සපයනු ලබන ප්‍රධාන ආයතන නියෝජනය වන පරිදි මෙම කමිටුවේ සාමාජිකයින් පත් කර ඇත.

කාර්යභාරය

I. ආර්ථික කටයුතු, රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා මූල්‍ය කටයුතු වලට අදාලව, අමාත්‍ය මණ්ඩල සංදේශ වල සඳහන් කරුණු අධ්‍යයනය කර ඒ සම්බන්ධව නිර්දේශ ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩලීය කමිටුව වෙත ඉදිරිපත් කිරීම.

II. පෞද්ගලික අංශයේ ආයෝජකයින් විසින් ඉදිරිපත් කරනු ලබන විවිධ ව්‍යාපෘති වාර්තා සඳහා සුදුසු ප්‍රතිපත්තිමය මඟ පෙන්වීමක් ලබා දීම

III. ආර්ථික කළමනාකරණය පිළිබඳ නිලධාරී කමිටුවට යොමුකරනු ලබන කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය උපදෙස් සහ මහපෙන්වීම් ලබාදීම හා ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුවෙහි අවධානය සඳහා යොමු කිරිම

IV. ආර්ථික කළමනාකරණය පිළිබඳ නිලධාරී කමිටුව හා ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව විසින් ගනු ලබන තීරණ වල ප්‍රගතිය අධීක්ෂණය කිරීම

**කමිටුවේ සංයුතිය**

| | |
|---|---|
| 1. ආර් පාස්කරලිංගම් මහතා | ජ්‍යෙෂ්ඨ උපදේශක, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය (සභාපති) |
| 2. චරිත රත්වත්තේ මහතා | අග්‍රාමාත්‍ය ජ්‍යෙෂ්ඨ උපදේශක |
| 3. සුමිත් අබේසිංහ මහතා | අමාත්‍ය මණ්ඩලයේ ලේකම් |
| 4. ආචාර්ය ආර් එච් එස් සමරතුංග මහතා | ලේකම් මුදල් අමාත්‍යාංශ |
| 5. එම් අයි එම් රෆීක් මහතා | ලේකම්, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය |
| 6. එම් සී එල් රොද්‍රිගෝ මහතා | අතිරේක ලේකම්, අග්‍රාමාත්‍ය කාර්යාලය |

2015.12.31 දිනට මෙම කමිටුවේ රැස්වීම් වාර 8ක් පවත්වා ඇත. අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, රාජ්‍ය ආයතන, සහ පෞද්ගලික අංශය විසින් තව දුරටත් ක්‍රියාමාර්ග ගතයුතු කරුණු, ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇති අමාත්‍ය මණ්ඩල තීරණ සහ අනිකුත් ඉල්ලීම් 75 ක් සඳහා මෙම කමිටුව විසින් නිරීක්ෂණ සහ නිර්දේශ ලබා දී ඇත.

### 3.3. ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලය පිහිටුවීම

ශ්‍රී ලංකාවේ ඉදිරි සංවර්ධන ඉලක්ක කරා කඩිනමින් ළඟාවීමට පැහැදිලි, පිළිගතහැකි සහ සාධාරණ වූ ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදන අංශයක් අග්‍රාමාත්‍ය කාර්යාලයේ ස්ථාපිත කර ඇත. නව රජයේ කාර්යයන් වේගවත් කිරීමට සහය වන, මෙම ප්‍රතිපත්ති සම්පාදන කාර්යාලය මඟින් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිතය.

1. ජාතික ප්‍රතිපත්ති සැළසුම් කිරීම හා සම්පාදනය කිරීම

2. ජාතික ප්‍රතිපත්ති රාමුව සකස් කිරීම

3. සංවර්ධන අරමුණු හා ඉලක්ක සකස් කිරීම

4. ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය සම්බන්ධීකරණය කිරීම

5. ප්‍රතිපත්ති සමාලෝචනය හා ඇගයීම

6. ශ්‍රී ලංකාවේ සංවර්ධන ක්‍රියාදාමය කෙරෙහි බාහිර සාධකයන්ගේ බලපෑම සමාලෝචනය කිරීම

මෙම කාර්යාලය විසින් සෞඛ්‍ය, ඉඩම් පවරා ගැනීම, තොරතුරු තාක්ෂණය, වැඩිහිටි සුරක්ෂිතතාවය, ළමා සුරක්ෂිතතාවය, ක්ෂුද්‍ර මූල්‍යකරණය, කෘෂි කර්ම ආදී ක්ෂේත්‍ර ගණනාවක් පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධයෙන් අවශ්‍ය මඟ පෙන්වීම් සිදු කර ඇත.

## 3.4 ප්‍රතිපත්ති සැකසීම සඳහා පත්කරන ලද අධ්‍යයන කමිටු

### 3.4.1 ආයෝජන, දිරි දීමනා සහ බදු පිළිබඳ අධ්‍යයන කමිටුව

අග්‍රාමාත්‍යවරයාගේ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ ජ්‍යෙෂ්ඨ උපදේශක ආර්.පාස්කරලිංගම් මහතාගේ සභාපතිත්වයෙන් යුත් ආයෝජන සඳහා දිරි දීමනා, ගාස්තු සහ බදු පිළිබඳව අධ්‍යයන කමිටුවක් අග්‍රාමාත්‍යවරයා විසින් 2015 ජූනි මස 04 වන දින පිහිටුවා ඇත. චරිත රත්වත්තේ මහතා (අග්‍රාමාත්‍ය ජ්‍යෙෂ්ඨ උපදේශක), අර්ජුන මහේන්ද්‍රන් මහතා (අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුව), ඒ.කේ.සෙනෙවිරත්න මහතා (අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය මූල්‍ය දෙපාර්තමේන්තුව), සොනාලි විජේරත්න මහත්මිය (අධ්‍යක්ෂ ජනරාල්, වාණිජ දෙපාර්තමේන්තුව), රංජිත් අශෝක මහතා (අධ්‍යක්ෂ ජෙනරාල්, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව), චම්පිකා මලල්ගොඩ මහත්මිය (අධ්‍යක්ෂ, ආයෝජන මණ්ඩල), මහාචාර්ය රොහාන් සමරජීව (ආරම්භක සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරි ලර්නි ඒෂියා (Lirne Asia) හැන්ස් විජේසූරිය මහතා (ප්‍රධාන විධායක නිලධාරි ඩයලොග් ආෂියාටා පුද්ගලික සමාගම) මුර්ටාෂා ජැෆර්ජී මයා (ප්‍රධාන විධායක නිලධාරි ජේ.බී.සෙකියුරිටීස් පුද්ගලික සමාගම) කමිටුවේ සෙසු සාමාජිකයෝ වූහ.

ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ රටේ ආයෝජන පරිසරය දියුණු කිරීමට අදාළ ගැටලු මෙන්ම ආයෝජන පරිසරය දියුණු කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ග හඳුනාගැනීම මෙම අධ්‍යයන කණ්ඩායමේ ප්‍රධාන අරමුණු විය.

කමිටුව විසින් අවස්ථා කිහිපයකදී, ආයෝජන ආකර්ෂණය කර ගැනීම සහ රටේ ආයෝජන අවස්ථා දියුණු කිරීමට අදාළ ගැටලු පිළිබඳව සාකච්ඡා කරනු ලැබීය. ඒ අනුව, ආයෝජන පරිසරය ආශ්‍රිත ගැටලු පිළිබඳ අවධානය යොමු කෙරෙන "ආයෝජන හිඩැස පිරවීම" පිළිබඳ වාර්තාවක් ආයෝජන මණ්ඩලයේ පර්යේෂණ හා ප්‍රතිපත්ති උපදේශක දෙපාර්තමේන්තුව මගින් සකස් කරනු ලැබීය. එකී වාර්තාව සම්බන්ධව කමිටු සාමාජිකයින්ගේ නිගමන සහ නිර්දේශ පදනම් කර ගනිමින් ආයෝජන මණ්ඩලය විසින් සංකල්ප පත්‍රයක් සකස් කර අග්‍රාමාත්‍යවරයාගේ නිරීක්ෂණය සඳහා යොමු කර ඇත.

### 3.4.2 ජාතික විශ්‍රාම වැටුප් කාර්යාලය සහ විශ්‍රාම වැටුප් උපදේශක කමිටුව පිහිටුවීම පිළිබඳ අධ්‍යයන කමිටුව

රට තුළ පවත්නා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම අධ්‍යයනය කිරීමට සහ විශ්ලේෂණය කිරීමට අග්‍රාමාත්‍ය ලේකම් ඊ එම් එස් බී ඒකනායක මහතාගේ සභාපතිත්වයෙන් යුත් බහුවිධ ක්ෂේත්‍රගත ප්‍රවීණයන්ගෙන් සමන්විත අධ්‍යයන කමිටුවක් අග්‍රාමාත්‍යවරයා විසින් පත් කර තිබේ. මේ සම්බන්ධයෙන් එක්සත් රාජධානිය, ඉන්දියාව සහ මැලේසියාව ආදී රටවල විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම ද අධ්‍යයනය කර ඇත. මෙම අධ්‍යයනයේ අරමුණ වනුයේ, පවත්නා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම ඒකාබද්ධ කරමින් ඒවායෙහි පරිපාලන කටයුතු විධිමත් කිරීමට සහ සමස්ත පිරිවැය කාර්යක්ෂමතාව සහ ඵලදායිත්වය ඉහළ නැංවීම උදෙසා ජාතික විශ්‍රාම වැටුප් කාර්යාලයක් (NPO) සහ ජාතික විශ්‍රාම වැටුප් කමිටුවක් පත් කිරීම වේ.

නව විශ්‍රාම වැටුප් කාර්යාලයක් සහ විශ්‍රාම වැටුප් උපදේශක කමිටුවක් ස්ථාපිත කිරීම සඳහා මේ වන විට සංකල්ප සටහන් කෙටුම්පත් (Draft Concept Notes) සකසා ඇත. මේ සම්බන්ධව පහසුකම් සැලසීම සඳහා ලෝක බැංකු නියෝජිත කණ්ඩායමක්ද එකඟ වී ඇති අතර රටේ පවත්නා විවිධ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සහ සමාජ සුභසාධන යෝජනා ක්‍රම පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක් සිදුකරමින් සිටී. සේවක අර්ථ සාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ ප්‍රතිලාභ පිළිබඳව කෙටි සංකල්ප සටහනක් ද සකසමින් ඇති අතර විධිමත් අංශවල සේවකයින් සඳහා සේවක අර්ථසාධක අරමුදල හරහා විශ්‍රාම ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කරමින් සිටී. ඒ අනුව, සේවක අර්ථ සාධක අරමුදලේ සහ සේවක භාරකාර අරමුදලේ සඵලදායිත්වය, කාර්යක්ෂමතාව සහ තිරසාරත්වය ඉහළ නැංවීම සඳහා ක්‍රියා මාර්ග ගැනීමට අවශ්‍ය කටයුතු ආරම්භ කරනු ලැබේ. ද්විගුණනය වැළැක්වීමත් නව යෝජනා ක්‍රම යටතේ ප්‍රතිලාභ ඉහළ නංවාලමින් සුදුසුකම් ලත් සියලු සේවකයින් ආවරණය වන පරිදි සහ මනා මූල්‍ය කළමනාකරණයක් සඳහා ප්‍රතිලාභ යෝජනා ක්‍රම පුළුල් කරමින් රට තුළ පවත්නා සියලු සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම සම්බන්ධ කෙරෙන කළමනාකරණ තොරතුරු පද්ධතියක් (Management Information System) පිහිටු වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී.

### 3.4.3 මැදි ආදායම්ලාභීන් සඳහා නිවාස සහ යටිතල පහසුකම් සංවර්ධනය වෙනුවෙන් පත් කරන ලද අධ්‍යයන කමිටුව

**"මාස 60 කින් අලුත් රටක් හදන පංචවිධ ක්‍රියාවලිය"** ප්‍රකාරව මැදි ආදායම්ලාභීන් වෙනුවෙන් නිවාස ලක්ෂ 5ක් ඉදිකිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා, ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍ය ජ්‍යෙෂ්ඨ උපදේශක ආර් පාස්කරලිංගම් මහතාගේ සභාපතිත්වයෙන් හා අග්‍රාමාත්‍ය ජ්‍යෙෂ්ඨ උපදේශක චරිත රත්වත්තේ මහතා හා නිවාස ඉදිකිරීම් අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය ඇතුළු පාර්ශ්වකාර ආයතනවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගෙන් සමන්විත අධ්‍යයන කමිටුවක් අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරන ලදී.

රාජ්‍ය අංශය හා පෞද්ගලික අංශය ඒකාබද්ධ වැඩසටහනක් ලෙස (Public Private Partnership) ක්‍රියාත්මක කරන මෙම වැඩසටහන මඟින් නිවාස ව්‍යාපෘති 04 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නියමිතය. මෙම වැඩසටහන සඳහා රජය විසින් පොදු ප්‍රවාහන පහසුකම් සහිත ඉඩම් සැපයීම, යටිතල පහසුකම් සැපයීම හා නිවාස ඉදිකිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර දීම මගින් දායකත්වය සපයන අතර, නිවාස සංවර්ධන ආයතන විසින් රජයේ අධීක්ෂණය යටතේ නිවාස ඉදි කරනු ලබයි. එසේම ප්‍රතිලාභීන් වෙත නිවාස ලබාදීමට මිල ගණන් තීරණය කරනු ලබන්නේද රජය විසිනි.

ඊට අමතරව ප්‍රතිලාභීන්ට නිවාස මිලදී ගැනීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික බැංකු මඟින් සහන පොලී අනුපාතයක් යටතේ ණය පහසුකම් ලබාදීමට ද කටයුතු කර ඇත.

මේ වන විට එම නිවාස ව්‍යාපෘති 04 ඉදිකිරීම සඳහා සුදුසු ඉඩම් හඳුනා ගෙන ඇති අතර යෝග්‍ය නිවාස සංවර්ධන ආයතන හඳුනා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කරමින් පවතී.

### 3.4.4 ක්‍රීඩා නීතිය පිළිබඳ අධ්‍යයන කමිටුව

සිය මැතිවරණ ප්‍රකාශයෙන් පොරොන්දු වූ පරිදි මැතිවරණයෙන් තේරී පත්වූ නව රජය විසින් ශ්‍රී ලංකා ජාතික ක්‍රීඩා සංවර්ධන අධිකාරිය ස්ථාපිත කිරීම සඳහා මේ වන විටත් අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින්, ඒ වෙනුවෙන් කැපවී ක්‍රියා කරයි. මෙම සංකල්පය ක්‍රියාත්මක කිරීම උදෙසා ඊට සුදුසු ආයතනයක්, කමිටුවක් ක්‍රීඩා අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් පත්කර ඇත. මෙම කර්තව්‍යයේදී පවත්නා ගැටළු සහ ඒවාට බලපා ඇති හේතු පිළිබඳව දැනුවත් වීමට සහ මෙම ගැටළු විසඳීමට අවශ්‍ය ක්‍රමෝපායන් හා යාන්ත්‍රණයක් හඳුනා ගැනීම පිණිස ක්‍රීඩා ක්ෂේත්‍රය පිළිබඳව සවිස්තරාත්මක සමාලෝචනයක් සිදු කිරීම අවශ්‍යව ඇත.

මෙහිදී, ජාතික ක්‍රීඩා සංගම් පවත්වාගෙන යාමේදී සහ එම සංගම් විසින් තීරණ ගැනීමේදී දේශපාලන මැදිහත්වීම් සිදුනොවීම සහ ක්‍රීඩාව කෙරෙහි බලපවත්නා රට තුළ ක්‍රියාත්මක නීති මඟින් තහවුරු විය යුතු බවට ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව ආදී ජාත්‍යන්තර ක්‍රීඩා ආයතන ගණනාවක් විසින් ප්‍රකාශ කරන ලද අදහස් සළකා බැලීමට කමිටුවට සිදුවනු ඇත. කෙසේ වෙතත් ශ්‍රී ලංකා රජය විසින් වාර්ෂිකව රටේ ක්‍රීඩා කටයුතු හා ක්‍රීඩා යටිතල පහසුකම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන ක්‍රීඩා අමාත්‍යවරයා වගකියනු ලබන සැළකිය යුතු අරමුදල් ප්‍රමාණයක් වෙන් කරන බව ද සඳහන් කළ යුතුය.

ඉහත සඳහන් කරන ලද පාර්ශවකරුවන්ගේ අවශ්‍යතා ඉටු කිරීමේදී හැකි හොඳම ආකාරයෙන් ඔවුන් අතර සියළු දෙනාට පිළිගත හැකි සාධාරණ ක්‍රමයක් ඇති කිරීමට කමිටුව අපේක්ෂා කරයි. රටේ සියළුම දෙනාට ක්‍රීඩාවන්ට පහසුවෙන් සහභාගීවීමට හැකියාව ලැබෙන අතරම දේශපාලන මැදිහත්වීම් වලින් තොර ශක්තිමත් ආයතනික රාමුවක් සකස් කිරීම සඳහා වන ශ්‍රී ලංකා රජයේ වැයමට සහාය වන අයුරින් ක්‍රීඩා කළමනාකරණය හා සංවර්ධනය විසින් මුහුණ දෙනු ලබන පවත්නා සියළුම ගැටළුවලට විසඳුම් ලබාදීම පිණිස ශ්‍රී ලංකාවේ ක්‍රීඩා කෙරෙහි බලපවත්නා රට

තුළ ක්‍රියාත්මක නීතියෙහි යම් වෙනසක් කළ යුතු වන්නේ නම් ශ්‍රී ලංකා රජයට නිර්දේශ කිරීම කමිටුව වෙත පවරන ලද කාර්යභාරයෙහි අරමුණ වනු ඇත.

කෙටි කාලීනව ක්‍රීඩා ක්ෂේත්‍ර තුළ සිටින වත්මන් පාර්ශවකරුවන් තෘප්තිමත් කිරීමේ අරමුණින් එම ක්ෂේත්‍ර තුළ පවත්නා දුර්වලතාවලට විසඳුම් ලබාදීම හා ඒවා තුරන් කිරීම වෙනුවෙන් දියත් කළ හැකි ක්‍රම පිළිබඳව සළකා බැලීමට පවරන ලද මෙම කාර්යභාරය මඟින් රජයට හැකියාව ලැබෙනු ඇත. මේ සම්බන්ධයෙන් ජාතික ක්‍රීඩා ආයතනය ඇතුළු විවිධ ක්‍රීඩා ආයතනවල භූමිකාව, වගකීම් මෙන්ම මේ වන විට පවත්නා එහි ව්‍යුහය සහ ක්‍රියාවලිය පැහැදිළි කර ගැනීම ක්‍රීඩාවේ කළමනාකරණය සහ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වී ඇත.

දීර්ඝ කාලීනව, රටේ ක්‍රීඩා ජයග්‍රහණ ලබා ගැනීම උදෙසා ජාත්‍යන්තර ක්‍රීඩා පිටියේ දක්ෂතා දක්වන ඉහළ කුසලතාවලින් පිරිපුන් ක්‍රීඩා කණ්ඩායම් සහ ක්‍රීඩකයින් බිහි කිරීම හරහා පුහුණු මානව සම්පත ඇතුළු රටේ ක්‍රීඩා යටිතල පහසුකම් වර්ධනය කිරීමට සහ උසස් කිරීමට මෙම පවරන ලද කාර්යභාරය මඟින් අපේක්ෂා කෙරේ.

මෙම කමිටුව සඳහා සාමාජිකයින් 2015.11.05 දින නැවත පත් කරන ලද අතර පහත සඳහන් අධ්‍යයන කණ්ඩායම සාමාජිකයින් ලෙස ක්‍රියා කරනු ඇත.

| | | |
|---|---|---|
| 01. | ජගත් ප්‍රනාන්දු මහතා, ජ්‍යෙෂ්ඨ විධායක නිලධාරී,<br>සීමාසහිත ජාගෝ පුද්ගලික සමාගම | - සභාපති |
| 02. | පාලිත කුමාරසිංහ මහතා, ජනාධිපති නීතිඥ | - සාමාජික |
| 03. | කේ.ඩී.එස්. රුවන් චන්ද්‍ර මහතා, අධ්‍යක්ෂ ජනරාල්<br>ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව | - සාමාජික |
| 04. | හර්ෂ අමරසේකර මහතා, ජනාධිපති නීතිඥ | - සාමාජික |
| 05. | මනෝජ් බණ්ඩාර මහතා | - සාමාජික |
| 06. | ජයාන්තිස්ස රත්වත්තේ මහතා, අධ්‍යක්ෂ<br>කුඩා තේවතු හිමියන්ගේ කර්මාන්ත ශාලා පී.එල්.සී. සමාගම | - සාමාජික |
| 07. | හේමසිරි ප්‍රනාන්දු මහතා, සභාපති - ජාතික ඔලිම්පික් කමිටුව | - සාමාජික |
| 08. | දීප්ති ළමාහේවා මහතා, ගරු ක්‍රීඩා අමාත්‍යවරයාගේ උපදේශක | - සාමාජික |

කෙටුම්පත් කරන ලද සංකල්ප පත්‍රිකාව අග්‍රාමාත්‍යවරයාගේ නිරීක්ෂණ සඳහා යොමු කර ඇත.

### 3.4.5 පාර්ලිමේන්තු පරිපාලනය පිළිබඳ අධ්‍යයන කමිටුව

අග්‍රාමාත්‍යවරයා විසින් පත් කරන ලද කමිටුවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමෙන් පසු 2015.12.09 දින පහත සඳහන් අංශ 16 සඳහා පාර්ලිමේන්තු අධීක්ෂණ කමිටු පත් කරන ලදි.

1. ආර්ථික සංවර්ධන
2. ජාත්‍යන්තර සහයෝගීතාවය
3. ජාතික ආරක්ෂාව
4. තිරසාර සංවර්ධනය, පරිසර සහ ස්වාභාවික සම්පත්
5. කාන්තා කටයුතු
6. අධ්‍යාපන සහ මානව සම්පත් සංවර්ධනය
7. සෞඛ්‍ය, මානව සුභසාධන හා සමාජ සවිබලගැන්වීම
8. ප්‍රවාහන සහ සන්නිවේදනය
9. කෘෂිකර්මාන්ත හා ඉඩම්
10. නීති කටයුතු සහ මාධ්‍ය
11. තරුණ කටයුතු, ක්‍රීඩා, කලාව හා ජාතික උරුමයන්
12. ව්‍යාපාර හා වාණිජ්‍ය
13. බලශක්තිය
14. නිෂ්පාදන හා සේවා
15. අභ්‍යන්තර පරිපාලනය සහ රාජ්‍ය කළමනාකරණය
16. සංහිඳියාව සහ උතුරු සහ නැගෙනහිර නැවත ඉදිකිරීම් කටයුතු

### 3.4.6 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමේ කමිටුව

2015.12.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය පිළිබඳ මහජන අදහස් විමසීමට අධි නීතිඥ ලාල් විජේනායක මහතාගේ සභාපතීත්වයෙන් යුක්තව, ෆායිස් මුස්තාපා මහතා, මහාචාර්ය ගාමිණී සමරනායක මහතා, මහාචාර්ය ඒ එම් නවරත්න බණ්ඩාර මහතා සහ එන් සෙල්වකුමාරන් මහතා ඇතුළු බහුවිධ ක්ෂේත්‍ර ගත ප්‍රවීණයන් විසි දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත් කර ඇත.

මෙම කමිටුව විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය සඳහා, ආගමික නායකයින්, දේශපාලන පක්ෂ නායකයින්, වෘත්තීයවේදීන්, සිවිල් සමාජ සහ සංවිධාන සහ මහජනතාව ඇතුලු සියළුම පාර්ශවයන්ගේ වාචික හා ලිඛිත අදහස් ලබාගැනීම අවසන් කර ඇත.

මෙම කමිටුවේ අවසන් වාර්තාව 2016.05.10 දින අග්‍රාමාත්‍යවරයා වෙත භාරදීමට නියමිතය.

### 3.4.7 යුරෝපා සංගම් ධීවර තහනම ඉවත්කර ගැනීමට අදාල මෙහෙයුම් කමිටුව

නීති විරෝධී, වාර්තා නොවූ හා අවිධිමත් ධීවර මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානය යොමු වන බව ඒත්තු ගැන්වීමට රජය අපොහොසත්වීම නිසා, ශ්‍රී ලාංකීය මත්ස්‍ය අපනයනයන් තහනම් කිරීමට, 2014 ඔක්තෝබර් මාසයේදී යුරෝපීය කොමිෂම මගින් යෝජනා කෙරිණ. මෙම තහනම 2015 ජනවාරි මස 13 වන දින සිට ක්‍රියාත්මක විය. යුරෝපා සංගමයට අලුත් හා ශීත කරන ලද තලපත් හා බල මාළු අපනයනයන කරනු ලබන දෙවන විශාලතම අපනයනකරු වූයේ ශ්‍රී ලංකාවයි. ඒ අනුව 2013 වසරේදී අපනයන ආදායම ස්ටර්ලිං පවුම් මිලියන 74 ක් විය. ඉහත කී තහනම හේතුවෙන් දළ වශයෙන් ඇ.එ.ජ.ඩොලර් මිලියන 100 ක පමණ වෙළඳපොලක් ශ්‍රී ලංකාවට අහිමි විය.

මෙම පසුබිම යටතේ, යුරෝපා සංගමය විසින් පනවා ඇති ධීවර රෙගුලාසි යටතේ ශ්‍රී ලංකාව සහයෝගය නොදක්වන රටක් ලෙස උපචාරානුකූලව ලැයිස්තුගතව තිබීම ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගැනීම සඳහා අග්‍රාමාත්‍යවරයා විසින් මෙහෙයුම් කමිටුවක් ස්ථාපිත කරන ලදී. අග්‍රාමාත්‍ය ලේකම්වරයාගේ සභාපතිත්වයෙන් යුක්ත වූ මෙම කමිටුව ධීවර අමාත්‍යාංශය, විදේශ කටයුතු අමාත්‍යාංශය, වාණිජ දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව සහ මුහුදු ආහාර අපනයනකරුවන්ගේ සංගමය යන ආයතනවල නියෝජිතයින්ගෙන් සමන්විත විය.

යුරෝපා කොමිෂමේ සමුද්‍රීය කටයුතු පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයා, ශ්‍රී ලංකාව විසින් වරින් වර සාක්ෂාත් කර ගනු ලබන ප්‍රගතිය නිරීක්ෂණය කිරීමෙහි ලා සක්‍රීය ලෙස කටයුතු කරන ලද අතර, අවසානයේදී කළමනාකරණ මෙහෙයුම් සත්‍ය වශයෙන්ම ඉටුවේද යන්න තහවුරු කර ගැනීම සඳහා 2015 නොවැම්බර් මාසයේදී මෙහි සංචාරය සඳහා දූත පිරිසක් එවන ලදී.

ශ්‍රී ලංකාව මත පනවා ඇති තහනම ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් යුරෝපා සංගම් කවුන්සිලයේ අවසාන නිගමනය 2016 ජූලි මාසයට පෙර ලැබෙනු ඇති බව ශ්‍රී ලංකා රජයේ ශුභවාදී විශ්වාසයයි. එවිට, ශ්‍රී ලංකා මුහුදු ආහාර යුරෝපා සංගමයේ රටවලට අපනයනය ද යළිත් ආරම්භවීමට මග සැලසෙනු ඇත.

### 3.4.8 රාජ්‍ය මුදල් කළමනාකරණයට අදාල නීති කෙටුම්පත් කිරීමේ කමිටුව

රාජ්‍ය මුදල් කළමනාකරණයට අදාල නීති කෙටුම්පත් කිරීම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ ජ්‍යෙෂ්ඨ උපදේශක චරිත රත්වත්ත මහතා, ජනාධිපති නීතිඥ ආචාර්ය ජයම්පති වික්‍රමරත්න මහතා හා මුදල් අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය ආර්.එච්.එස්.සමරතුංග මහතා ඇතුළු සාමාජිකයන් නව දෙනෙකුගෙන් සැදුම්ලත් කමිටුවක් පිහිටුවනු ලැබූ අතර මෙම කමිටුවෙහි ප්‍රධානතම අරමුණු වන්නේ, මුදල් අමාත්‍යාංශය විසින් කෙටුම්පත් කර ඇති නව මූල්‍ය රෙගුලාසි අධ්‍යයනය හා සමාලෝචනය, රාජ්‍ය මුදල් කළමනාකරණය සඳහා පවත්නා නීති රාමුව සමාලෝචනය සහ රාජ්‍ය මුදල් කළමනාකරණයට අදාල නීති කෙටුම්පත් කිරීමයි.

විශේෂයෙන්ම අනෙකුත් පාර්ශ්වකරුවන් සමඟ වැඩමුළුවක් පවත්වා ඔවුන්ගේ අදහස් විමසා බැලීමට අපේක්ෂිත අතර, 2016 ජූනි මාසය අවසානය වන විට සියළුම කෙටුම්පත් නිම කිරීමට සැලසුම් කර ඇත.

### 3.4.9 කොළඹ සංස්කෘතික කේන්ද්‍රස්ථානය ස්ථාපිත කිරීම සම්බන්ධයෙන් නිර්දේශ ලබාදීමේ කමිටුව

යෝජිත කොළඹ සංස්කෘතික කෙන්ද්‍රස්ථානය සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අග්‍රාමාත්‍යවරයා විසින් මෙම කමිටුව පත් කරන ලදී. මනෝ වන්මුගම් මහතාගේ සභාපතීත්වයෙන් යුත් මෙම කමිටුවේ මහාචාර්ය සරත් අමුණුගම මහතා, චන්ද්‍රගුප්ත තේනුවර මහතා, සන්ඩ්‍රි ඩේවිඩ් රෝඩ්රිගෝ මහත්මිය සහ ලයනල් ප්‍රනාන්දු මහතා මෙම කමිටුවේ සෙසු සාමාජිකයින් අතර වේ. මෙහි මූලික අරමුණ වන්නේ "කොළඹ සංස්කෘතික කෙන්ද්‍රස්ථානය" ස්ථාපිත කිරීම මඟින් දකුණු ආසියාවේ දෘශ්‍ය හා අභිවාහ්‍ය කලා සඳහා නාභි ලක්ෂ්‍යයක් නිර්මාණය කිරීමයි.

මෙම කමිටුව විසින් නෙළුම් පොකුණ, ජෝන් ද සිල්වා රඟහල, එල්පින්ස්ටන් හා නවරඟහල වැනි දිවයිනේ ප්‍රමුඛතම අභිවාහ්‍ය රංගශාලාවල රැඟුම් පානා ජාත්‍යන්තර රංගන ශිල්පීන් සඳහා ධ්වනි සහ දෘශ්‍ය පරිපූර්ණත්වයේ අවධානග්‍රාහී ප්‍රමිතීන් සාක්ෂාත් කර ගැනීමත් සමග තීරණ ගණනාවකට එළඹ ඇත.

රාජ්‍ය සංධ්වනි වාදක වෘන්දය, රාජ්‍ය සංගත වාදක වෘන්දය ( බටහිර, පෙරදිග වාදක වෘන්දය සහ බෙර) සහ ජාතික නර්තන සමාගම මෙම කේන්ද්‍රස්ථානය මගින් අධීක්ෂණය කිරීමට නියමිතය. "ආසියානු ශාන්තිකර Choir Games - 2017"ඉසව්ව සංවිධානය කිරීමට කමිටුව අපේක්ෂා කරන අතර, මෙය ශ්‍රී ලංකා සංචාරක කර්මාන්තයේ සංවර්ධනයට ඉවහල් වනු ඇත.

## 4. ජාතික සංහිඳියාව, සමාජ සුභසාධනය සහ ආගමික කටයුතු

### 4.1 ජාතික සංහිඳියාව

දශක තුනකට ආසන්න කාලයක් පැවති යුද්ධය 2009 වර්ෂයේ දී අවසන් වුවත්, ශ්‍රී ලාංකිකයන් හට මේ දක්වා සැබෑ සංහිඳියාවක් ළඟා කර ගැනීමට නොහැකි වී ඇත. එබැවින් ශ්‍රී ලාංකාවේ සියලු ආගමික හා වාර්ගික ජන කණ්ඩායම් සමඟ සාකච්ඡා කර දේශීය නීතිමය රාමුව තුළ යාන්ත්‍රණයක් සකස් කිරීමට වර්තමාන රජය පියවර ගෙන ඇත.

සියලු ජන කොටස්වලට සාධාරණ ලෙස ජීවත් වීමට හැකි සාධාරණ සමාජයක් බිහිකිරීමට නව රජය නොපමාව කටයුතු කරමින් සිටින අතර අන්තර් ආගමික සහජීවනය වර්ධනය කිරීම උදෙසා සෑම ආගමකම එක් උත්සවයක් ජාතික උත්සවයක් ලෙස අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සැමරීමට ද කටයුතු යොදා තිබේ.

#### 4.1.1 අග්‍රාමාත්‍යවරයාගේ උතුරු පළාත් සංචාරය




අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා 2015 වර්ෂයේ මාර්තු මස 27 - 29 දිනයන් හි උතුරු පළාතේ සිදු කරන ලද නිල සංචාරය උතුරු පළාතේ වැසියන්ට පමණක් නොව සමස්ත ශ්‍රී ලාංකික පුරවැසියන්ට ද ඉතාමත් වැදගත් නිල සංචාරයක් විය. මෙම සංචාරයේ දී වැදගත් ක්ෂේත්‍ර කිහිපයක් පිළිබඳ කරුණු සොයා බැලූ අග්‍රාමාත්‍යවරයා රාජ්‍ය නිලධාරීන්ට එම ක්ෂේත්‍රයන් හි පවතින ගැටලු විසඳීමට අවශ්‍ය උපදෙස් හා වගකීම් පවරන ලදි.

උතුරු පළාතේ ජනතාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට හා උතුරු පළාතේ සංවර්ධන කටයුතු වේගවත් කිරීමට යෝජිත වැඩසටහන් පහත පරිදි සංක්ෂිප්තව දැක්විය හැක.

- කාන්තා මූලික කුටුම්භයන් හි සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම පිණිස කාන්තා මූලික කුටුම්භ සඳහා ජාතික මධ්‍යස්ථානයක් කිලිනොච්චියේ පිහිටුවීම
- උතුරු පළාතේ කාන්තා මූලික කුටුම්භ විසින් මුහුණ දෙන ගැටලු අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම
- යුධ හමුදාව විසින් ලබා දීමට නියමිත ඉඩම් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල නැවත පදිංචි කිරීමේ කාර්යය පිළිබඳ සවිස්තරාත්මක සැලැස්මක් ඉදිරිපත් කිරීම
- යුධ හමුදාව විසින් අත්පත් කර ගෙන ඇති සිවිල් පුද්ගලයන්ට අයත් ඉඩම් ඒවායේ අයිතිය තහවුරු කර ගැනීමෙන් අනතුරුව අයිතිකරුවන් වෙත ඉඩම්වල අයිතිය ලබාදීම
- ඉන්දියානු නිවාස යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යයන කමිටුවක් පත් කිරීම
- ඉරනතිව් දූපතේ වැසියන් නැවත පදිංචි කිරීමේ හැකියාව පිළිබඳ සොයා බැලීමට නාවික හමුදාව වෙත පැවරීම
- ඉඩම් බලපත්‍ර ලබාදීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීම
- වනාන්තර ලෙස සළකනු ලබන ප්‍රදේශවල පුද්ගලයින් නැවත පදිංචි කිරීම
- අයිකච්චි හි පුද්ගලයින් නැවත පදිංචි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම
- කිලිනොච්චිය සහ මුලතිව් දිස්ත්‍රික්කවල පිහිටි පාසල් සඳහා ගුරුවරුන් බඳවා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කිරීම
- උතුරු පළාතේ පිහිටි පාසල්වල අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීම සඳහා කමිටුවක් පත් කිරීම
- සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව මඟින් ගෙවීම් කරනු ලබන ගුරුවරුන්ගේ සේවයට අදාළ ධනාත්මක යෝජනා ඉදිරිපත් කිරීම
- වව්නියාවේ ගාමිණී මධ්‍ය මහා විදුහලේ වත්මන් තත්ත්වය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීම
- මන්නාරම දිස්ත්‍රික්කයේ පිහිටි සියලුම පාසල්වලට පැසිපන්දු ක්‍රීඩා කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීම
- ධීවර ජනතාව වෙත ලබා දී ඇති ණය මුදලින් 50% කපා හැරීමේ යෝජනාවක් ඉදිරිපත් කිරීම
- ඉන්දියානු ධීවරයින්ගේ ගැටලු විසඳීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම
- ඉහළ ගුණාත්මකභාවයකින් යුක්ත මාළු දැල් අමාත්‍යාංශය විසින් තහවුරු කර ධීවර ජනතාව අතර බෙදා හැරීම
- නීත්‍යානුකූල නොවන ක්‍රම භාවිතා කරමින් මසුන් ඇල්ලීමට විරුද්ධව ක්‍රියා කිරීම
- අධි ආරක්ෂිත කලාපයේ හා හානියට පත් ආගමික ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම ආරම්භ කිරීම
- පානීය ජල ගැටලු පිළිබඳ සවිස්තරාත්මකව සාකච්ඡා කිරීම හා ප්‍රජා ජල ව්‍යාපෘති සඳහා විදේශ ආධාර ලබා ගැනීමේ හැකියාව සොයා බැලීමට කටයුතු කිරීම

- කාන්තාවන් විසින් පොලිස් ස්ථාන වෙත කරන ලද පැමිණිලි පිළිබඳ නිසි අවධානය යොමු කිරීම
- ආබාධිත පුද්ගලයින් පිළිබඳ අධ්‍යයනය කිරීම සඳහා කමිටුවක් පත් කිරීම
- ආබාධිත පුද්ගලයින් සඳහා සේවාවන් සැපයීමට ප්‍රාදේශීය මධ්‍යස්ථානයක් කිලිනොච්චියේ පිහිටුවීම
- ව්‍යාපාරික ප්‍රජාව මුහුණ දෙන ගැටලු පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීම
- ඉරනමඩු ජලාශය ඇතුළු උතුරු පළාතේ පිහිටි ජලාශ සංවර්ධනය පිළිබඳ සවිස්තරාත්මක වාර්තාවක් ලබා දීම පිළිබඳ කමිටුවක් පත් කිරීම
- 2016 වර්ෂයේ ජාතික ක්‍රීඩා උත්සවය යාපනයේ පැවැත්වීමට තීරණය කිරීම හා ක්‍රීඩා භූමි ප්‍රතිසංස්කරණය කඩිනම් කිරීම සඳහා කමිටුවක් පත් කිරීම
- ප්‍රථම ප්‍රාදේශීය තරුණ මධ්‍යස්ථානය යාපනයේ පිහිටුවීම
- නොමිලේ Wi-Fi පහසුකම් ලබා දීම යටතේ කොළඹින් පසුව යාපනයේ Wi-Fi කලාප පිහිටුවීමට පියවර ගැනීම
- උතුරු පළාතෙන් පොලිස් නිලධාරීන් 400ක් බඳවා ගැනීමට කටයුතු කිරීම
- ඉඩම් ගොඩකර පලාලි හි ගුවන් පථයක් ඉදිකිරීම
- උතුරු පළාත් සභාව යටතේ පෙර පාසල් පවත්වාගෙන යාම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීම
- නීති විරෝධී මත්පැන් සම්බන්ධයෙන් අදාළ නීති දැඩිව ක්‍රියාත්මක කිරීම
- හාට්ලි විද්‍යාලය සඳහා නව තෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම, නව බස් රථයක්, කාය වර්ධන මධ්‍යස්ථානයක් ලබාදීම
- උතුරු පළාතේ කර්මාන්ත කලාපයක් පිහිටුවීම
- ක්‍රිස්තියානි ආගම විෂය ඉගැන්වීම සඳහා ගුරුවරුන් බඳවා ගැනීම

## 4.2 සමාජ සුභසාධනය හා ආගමික කටයුතු

### 4.2.1 සමාජ සුභසාධනය

අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් සහ මඟපෙන්වීම යටතේ, අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් පහත සඳහන් සමාජ සුභසාධන වැඩසටහන් සිදු කරන ලදී.

#### 4.2.1.1 අලුත් අවුරුදු උත්සවය පැවැත්වීම

අග්‍රාමාත්‍ය කාර්යාලයේ සුභසාධක සංගමය විසින් වාර්ෂිකව සංවිධානය කරනු ලබන බක්මහ උළෙල 2015.04.25 දින බම්බලපිටිය පොලිස් ක්ෂේත්‍ර බළකා මූලස්ථානයේ දී මහාචාර්ය මෛත්‍රී වික්‍රමසිංහ මැතිනියගේ ප්‍රධානත්වයෙන් පැවැත් වුණි. මේ සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයේ සියලුම කාර්ය මණ්ඩලය සහ ඔවුන්ගේ පවුල්වල සාමාජික සාමාජිකාවෝ ද ඇතුළුව 600ක පිරිසක් පමණ සහභාගි වූහ. සාමාජික සාමාජිකාවන්ගේ කුසලතා, අන්‍යෝන්‍ය සුහදතාවය සහ කණ්ඩායම් හැඟීම් වර්ධනය කිරීමේ අරමුණෙන් කණ්ඩායම් සහ කේවල තරග රාශියක් එහිදී පැවැත්වුණි.

**4.2.1.2 නේපාල භූමිකම්පාවෙන් විපතට පත් ජනතාවට සහන සැලසීම**

2015 අප්‍රේල් 25 වන දින නේපාලයේ කත්මණ්ඩු නුවර හා ඒ ආසන්නයේ සිදුවූ රිච්ටර් මාපක 7.8ක ප්‍රභලත්වයෙන් යුත් භූකම්පනය හේතුවෙන් විපතට පත් වූ නේපාල ජනතාවට නොපමාව හැකි උපරිම ආකාරයෙන් සහන සැලසීමට අග්‍රාමාත්‍යවරයාගේ උපදෙස් ප්‍රකාරව අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගන්නා ලදී.

එදිනම රාත්‍රියේදී ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ යාත්‍රා බලගණයට අයත් විශාලතම භාණ්ඩ ප්‍රවාහන ගුවන් යානය වූ C 130 වර්ගයේ ගුවන්යානයක් මඟින් ඒ වන විට නේපාල ජනතාවට අවශ්‍යව තිබූ පානීය ජලය, අත්‍යාවශ්‍ය භාණ්ඩ සහ ඖෂධ ආදියෙන් සමන්විතව ස්වේච්ඡා සහන සේවා කණ්ඩායමක්ද නේපාලයට පිටත් කරන ලදී. භූමිකම්පාව සිදුවූ සැනින් නේපාලය බලා ළඟා වූ ප්‍රථම විදේශීය සහන සේවා කණ්ඩායම් ත්‍රිත්වය අතරට එක්වීමට ශ්‍රී ලංකාවේ මෙම සහන සේවා කණ්ඩායමට හැකිවිය. නේපාලයේ අවතැන් භාවයට පත්වූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් හා වන්දනාකරුවන් ඇතුළු ශ්‍රී ලාංකිකයන් 42 දෙනෙකුද, 2015.04.28 දින නැවත මෙම ගුවන් යානය මඟින්ම ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා ලදී.

අග්‍රාමාත්‍යවරයාගේ විශේෂ ඉල්ලීම මත සහන සැලසීම සඳහා ඉදිරිපත් වූ වෛද්‍ය කණ්ඩායම් හා අත්‍යාවශ්‍ය ආධාර නිසි ලෙස සම්බන්ධීකරණය කිරීම සඳහා, විශේෂ මෙහෙයුම් මැදිරියක් අග්‍රාමාත්‍ය කාර්යාලයේ දී ස්ථාපනය කරන ලදී. මෙමඟින් විදේශ කටයුතු අමාත්‍යාංශය, ආපදා කළමනාකරණ අමාත්‍යාංශය, දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ශ්‍රී ලංකන් ගුවන් සේවය ඇතුළු සියලුම සහන සේවා කණ්ඩායම් සමඟ සම්බන්ධීකරණය සිදු කරමින් වෛද්‍ය සැපයුම් හා කාර්ය මණ්ඩලය ඇතුළු අත්‍යාවශ්‍ය භාණ්ඩ ද නේපාලය වෙත පිටත්කර හරින ලදී.

2015.04.29 දින ශ්‍රී ලංකන් ගුවන් සේවයට අයත් UL 4195 / UL 4196 දරන විශේෂ මගී ගුවන් යානය මඟින් ශ්‍රී ලංකා යුධ හමුදාවේ මේජර් ජනරාල් මෛත්‍රී ඩයස් මහතාගේ මූලිකත්වයෙන් යුක්තව සිවිල් වෛද්‍ය උපදේශකවරුන්, හමුදා නිලධාරීන් හා ගලවා ගැනීමේ හා සහන සේවා කටයුතු සඳහා විශේෂ පුහුණුවක් ලද හමුදා සෙබලුන් 145 දෙනකුගෙන් යුක්ත කණ්ඩායමක් සහ ජාතික ආපදා කළමනාකරණ මධ්‍යස්ථාන හරහා පරිත්‍යාග ලෙස රැස් කරන ලද අත්‍යාවශ්‍ය භාණ්ඩ හා බෙහෙත් ද්‍රව්‍ය රැසක්ද නේපාලය වෙත පිටත් කර හරින ලදී.

මෙම සහන සේවා සැපයීම හා ඉදිරි පුනරුත්ථාපන වැඩපිළිවෙල සම්බන්ධයෙන් සොයා බැලීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍ය ගරු ඒ එච් එම් ෆවුසි මැතිතුමා සහ නියෝජ්‍ය අමාත්‍ය ගරු (වෛද්‍ය) අනෝමා ගමගේ මැතිතුමිය සහ අග්‍රාමාත්‍ය ලේකම් ඊ එම් එස් බී ඒකනායක මහතා ඇතුළු රජයේ උසස් නිලධාරීහු කිහිප දෙනෙක්ද නේපාලය බලා පිටත්වූහ. එම ගුවන්යනය මඟින් ශ්‍රී ලාංකිකයන් 21 දෙනෙකුගෙන් යුතු පිරිසක්ද නැවත ශ්‍රී ලංකාව බලා රැගෙන ඒම සිදුවිය. එම

ගුවන් යානය මගින් ම 2015.05.01 දින නැවත වරක් වියළි ආහාර හා අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ආධාර නේපාලය වෙත රැගෙන යන ලදී.

මීට අමතරව පරිත්‍යාග ලෙස අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලද රු. 3,445,390.00 ක මුදලක් භූමිකම්පාව නිසා ආපදාවට ලක්ව තිබූ Swayambhu හි පිහිටි ආනන්ද කුටි බෞද්ධ විහාරස්ථානය හා ලලිත්පූර් හි පිහිටි Rato Machindranath හින්දු කෝවිල ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය වෙත ලබා දෙන ලදී.














### 4.2.1.3 ලේ දන් දීමේ ව්‍යාපාරය

අග්‍රාමාත්‍ය කාර්යාලය ජාතික රුධිර පාරවිලයනය සේවය සමඟ සම්බන්ධීකරණය වී ලේ දන්දීමේ වැඩසටහනක් 2015.04.30 වන දින අග්‍රාමාත්‍ය කාර්යාලයේ දී පවත්වන ලදී. එහිදී අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධාරී මහත්ම මහත්මීන් සිය දෙනෙකු පමණ ලේ දන්දීමේ කර්තව්‍යයට දායකත්වය සැපයනු ලැබීය.

### 4.2.1.4 මීරිගම වැඩිහිටි නිවාසය ප්‍රතිසංස්කරණය කිරීම

අග්‍රමාත්‍ය කාර්යාලය, මයුර අම්මාන් සුභසාධන සංගමය සමඟ සම්බන්ධීකරණය වී, සමාජ සේවා දෙපාර්තමේන්තුව යටතේ පවත්වාගෙන යනු ලබන "සෙත් සෙවණ" වැඩිහිටි නිවාසය ප්‍රතිසංස්කරණය කරන ලදී. මෙම වැඩසටහන යටතේ එක් වැඩිහිටි කාන්තා නේවාසිකාගාරයක් සම්පූර්ණයෙන් ප්‍රතිසංස්කරණය කරන ලදී අතර පොළව මත පිඟන් ගඩොල් ඇතිරීම, නව ඇඳන් කොට්ට මෙට්ට සහ ඇඳ ඇතිරිලි ලබා දීම ද එම වැඩසටහනට ඇතුළත් විය. ප්‍රතිසංස්කරණය කරන ලද නේවාසිකාගාරය අග්‍රාමාත්‍ය ලේකම් ඊ.එම්.එස්.බී. ඒකනායක මහතාගේ ප්‍රධානත්වයෙන් 2016 මැයි මස 07 වන දින විවෘත කරන ලද අතර, එම අවස්ථාවේ දී පළතුරු පැළ 100 ක් රෝපණය කිරීම ද සිදු විය.









### 4.2.2 ආගමික කටයුතු

නව රජය පත්වීමෙන් අනතුරුව බෞද්ධ, හින්දු, ඉස්ලාම් හා ක්‍රිස්තියානි යන ආගම් අතර, ආගමික සංහිඳියාව ඇතිකරලීම සඳහා සෑම ආගමක් ම නියෝජනය වන පරිදි එක් ප්‍රධාන ආගමික වැඩ සටහනක් ජාතික මට්ටමින් අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් සැමරිමට කටයුතු කර ඇත. ඒ පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

#### 4.2.2.1 නව වන බුද්ධ රශ්මි වෙසක් මංගල්‍යය


අග්‍රාමාත්‍ය කාර්යාලය හා ගංගාරාම විහාරස්ථානයේ සහයෝගයෙන් යුක්තව සංවිධානය කරනු ලැබූ බුද්ධ රශ්මි වෙසක් මංගල්‍යය 9 වන වරටත් සාර්ථක ලෙස 2015 මැයි මස 03,04,05 සහ 06 යන දිනයන්හි දී පැවැත්විණි.

කොළඹ නගරයේ පවත්වනු ලබන ප්‍රධානතම ජාතික වෙසක් උත්සවය වන මෙහි මූලික අරමුණු වනුයේ සර්වඥ ධාතු ප්‍රදර්ශනය, වෙසක් කුඩු ප්‍රදර්ශනය, පාසල් සිසුන්ගේ වෙසක් නිර්මාණ, හක්ති ගී, බෞද්ධ ජාතක කතා ඇසුරින් ඉදිරිපත් කරන වේදිකා නාට්‍ය, වෙසක් තොරණ, දන්සැල්, රූකඩ සංදර්ශන හා බෞද්ධ නාට්‍ය ප්‍රදර්ශනය කිරීම මඟින් බුද්ධාලම්භන ප්‍රීතිය ඇති කිරීම සහ සංස්කෘතික උරුමයන් ඔප්නැංවීමයි.

මෙම වෙසක් කලාපය බේරේ වැව වට රවුම් පාර හා බේරේ වැව ආශ්‍රිතව මෙන්ම ගංගාරාම විහාරස්ථානය, ජිනරතන මාවත, මුත්තයියා මාවත, සර් ජේම්ස් පීරිස් මාවත, පෙරහැර මාවත, ශ්‍රී උත්තරානන්ද මාවත සහ නවම් මාවත යන ස්ථාන මූලික කරගෙන පැවැත්විණි.









#### 4.2.2.2 ඉෆ්තාර් උත්සවය

ඉස්ලාම් භක්තිකයන් හදබැතියෙන් සමරනු ලබන ඉෆ්තාර් උත්සවය මව්ලවිතුමන්ලාගේ සහ 1500 ක් පමණ මුස්ලිම් බැතිමතුන්ගේ සහභාගීත්වයෙන් 2015 ජුනි මස 29 දින අතිගරු ජනාධිපතිතුමාගේ හා අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පැවැත්වන ලදී.










### 4.2.2.3. දීපවාලි උත්සවය

අග්‍රාමාත්‍ය කාර්යාලය හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය විසින් සංවිධානය කරන ලද දීපවාලි ජාතික උත්සවය 2015 වර්ෂයේ නොවැම්බර් මස 10 දින අග්‍රාමාත්‍යවරයාගේ ප්‍රධානත්වයෙන් අරලියගහ මන්දිරයේ දී පවත්වන ලදි. හින්දු අලුත් අවුරුද්ද මුලික කොට ගෙන පවත්වනු ලබන මෙම ආගමික උත්සවයේ අරමුණු වනුයේ අඳුර පරයා ආලෝකය ද, නපුර පරදා යහපත ද උදා කිරීමයි.

මෙම උත්සව අවස්ථාවේ දී විෂ්ණු දෙවියන් සඳහා හින්දු පූජකවරුන් විසින් පුද පූජා පැවැත්වීම සහ පාසල් ළමුන් විසින් සංස්කෘතික අංග ඉදිරිපත් කිරීම ද සිදු විය.









#### 4.2.2.4. නත්තල් උත්සවය

දිවයිනේ සියලු ප්‍රදේශ නියෝජනය කරමින් පැමිණි අඩු ආදායම්ලාභී ළමුන් දහසකට අධික සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන් සහ ගරු ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යවරයා හා එම මැතිනිය සහ ගරු අමාත්‍යවරුන් කිහිපදෙනෙකුගේ ප්‍රධානත්වයෙන් 2015.12.17 දින නත්තල් උත්සවයක් අරලියගහ මන්දිරයේ දී පැවැත්විණි. එහිදී යාඥා මෙහෙයක් පැවැත්වුණ අතර පැමිණ සිටි ළමුන් වෙනුවෙන් නත්තල් කැරෝල්, නත්තල් නාට්‍ය ඉදිරිපත් කළ අතර ළමුන් සඳහා ආහාර පාන සහ ත්‍යාග ආදිය ලබා දීමත් සිදුවිය.








## 5. මහජන පැමිණිලි හා දුක්ගැනවිලි සඳහා සහන සැලසීම

### 5.1 අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලැබෙන මහජන පැමිණිලි / දුක් ගැනවිලි අදාළ රාජ්‍ය ආයතන වෙත යොමු කිරීම

වසර ගණනාවක් තිස්සේ මහජනතාවට විසඳා ගැනීමට නොහැකිව තිබූ ප්‍රශ්න හා ගැටලු විසඳා ගැනීමේ අරමුණින් අග්‍රාමත්‍යවරයා වෙත යොමු කරනු ලබන ලිපි රාශියක් දිනපතා අග්‍රාමාත්‍ය කාර්යාලය වෙත ලැබේ. මෙලෙස ලැබෙන මහජන පැමිණිලි / දුක් ගැනවිලිවලට විසඳුම් ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු කඩිනමින් ඉටු කිරිමේ අරමුණින් අග්‍රාමාත්‍ය කාර්යාලය තුළ වෙනම අංශයක් ස්ථාපිත කරන ලදී.

එම අංශය විසින් හඳුනාගෙන ඇති පරිදි මහජන පැමිණිලි / දුක්ගැනවිලි පහත පරිදි වර්ග කළ හැක.

- ඉඩම් ගැටලු
- නිවාස ගැටලු
- නඩු තීන්දු වලට අදාළ ගැටලු
- සහනාධාර / ජීවනාධාර වන්දි ඉල්ලීම්
- පාසල් සඳහා ළමුන් ඇතුළත් කිරීමට ඉල්ලීම්
- රැකියා ගැටලු
    - රැකියා ඉල්ලුම් කිරීම්
    - නැවත රැකියාවේ පිහිටුවන ලෙස ඉල්ලීම්
    - ස්ථාන මාරුවීම්

- පොදු පහසුකම්

    - මාර්ග ඉදිකිරීම් හා පිළිසකර කිරීම්
    - නළ ජලය සහ විදුලි බලය ලබා ගැනීම සඳහා ඉල්ලීම

- අක්‍රමිතා

    - පොලිස් දෙපාර්තමේන්තුවට එරෙහි පැමිණිලි
    - දූෂණ හා වංචා
    - ආයතන ප්‍රධානීන්ගේ අක්‍රමිකතා

- දේශපාලන පළිගැනීම්


2015 වර්ෂය තුළ ලැබුණු ලිපි සහ ඒ සඳහා ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවක් පහත දැක්වේ.

| මාසය | ලද ලිපි සංඛ්‍යාව (මහජන පැමිණිලි / දුක්ගැනවිලි) | පිළිතුරු යවන ලද ලිපි සංඛ්‍යාව |
|---|---|---|
| ජනවාරි | 700 | 620 |
| පෙබරවාරි | 390 | 350 |
| මාර්තු | 530 | 512 |
| අප්‍රේල් | 470 | 466 |
| මැයි | 800 | 750 |
| ජූනි | 436 | 422 |
| ජූලි | 510 | 500 |
| අගෝස්තු | 552 | 551 |
| සැප්තැම්බර් | 917 | 865 |
| ඔක්තෝම්බර් | 1,256 | 1,247 |
| නොවැම්බර් | 1,590 | 1,586 |
| දෙසැම්බර් | 3,204 | 3,201 |
| **එකතුව** | **11,355** | **11,070** |

මෙම පැමිණිලි හා දුක් ගැනවිලි සඳහා විසඳුම් ලබාදීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් එම ලිපි කඩිනමින් පහත සඳහන් ආයතන / නිලධාරීන් වෙත යොමු කරන අතර ඊට අදාළ පසුවිපරම් කටයුතු ද සිදු කරනු ලබයි.

- අමාත්‍යාංශ ලේකම්වරු
- දිස්ත්‍රික් ලේකම්වරු
- දෙපාර්තමේන්තු ප්‍රධානීන්
- සංස්ථා / සමාගම් / ව්‍යවස්ථාපිත ආයතන ප්‍රධානීන්
- ප්‍රාදේශීය ලේකම්වරු
- පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්

**5.2 අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය මගින් මහජන පැමිණිලි / දුක් ගැනවිලි ඉදිරිපත් කිරීමට සලසා ඇති පහසුකම්**



# 6. පාර්ලිමේන්තු කටයුතු අංශය

## 6.1. අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල සටහන්, පනත් කෙටුම්පත් සහ පාර්ලිමේන්තු ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම

ඉහත කාර්යයන් සිදු කිරීම සඳහා අග්‍රාමාත්‍ය කාර්යාලයෙහි පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ අංශයක් පිහිටුවා ඇති අතර එමගින් පහත සඳහන් කාර්යභාරය ඉටු කෙරේ.

(අ) අග්‍රාමාත්‍යවරයා, විසින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ, අමාත්‍ය මණ්ඩල සටහන් සහ පනත් කෙටුම්පත් සකස් කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි. ඒ අනුව, 2015 වර්ෂය තුළ දී අග්‍රාමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල සංදේශ 94 ක් සහ අමාත්‍ය මණ්ඩල සටහන් 27 ක් අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කර ඇත.

(ආ) ස්ථාවර නියෝග යටතේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් අග්‍රාමාත්‍යවරයාගෙන් විමසන ලද වාචික හා වාචික නොවන පිළිතුරු අපේක්ෂා කරනු ලබන ප්‍රශ්න සම්බන්ධයෙන් අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය වී පිළිතුරු සකස් කිරීම ද මෙම අංශය මඟින් සිදු කරයි. එමෙන්ම අග්‍රාමාත්‍යවරයා මඟින් පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු කොමිෂන් සභා, ව්‍යවස්ථාපිත ආයතන, රාජ්‍ය සංස්ථා ආදියෙහි වාර්ෂික වාර්තා හා ගිණුම් වාර්තා සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම ද මෙම අංශය විසින් සිදු කරනු ලබයි. ඒ අනුව, 2015.12.31 දින වන විට ගරු අග්‍රාමාත්‍යතුමා විසින් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න 48 ක් සඳහා පිළිතුරු කෙටුම්පත් කොට ඇති අතර, වාර්ෂික වාර්තා හා ගිණුම් වාර්තා 05 ක් සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත.

(ඇ) එමෙන්ම, වෙනත් අමාත්‍යාංශ මඟින් අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ වලට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් ලබාදෙන ලද තීරණ ක්‍රියාත්මක කිරීමේ වගකීම අග්‍රාමාත්‍ය ලේකම් වෙත පවරන ලද අවස්ථාවන් හීදී එයට අදාළව ඉදිරි කටයුතු සිදු කිරීම ද පාර්ලිමේන්තු කටයුතු අංශය යටතේ සිදු කරනු ලබයි.

## 6.2. විදේශ නිවාඩු

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ රජයේ ආයතනවල මාණ්ඩලික නිලධාරීන් රාජකාරී සහ පෞද්ගලිකව විදේශ ගත වීමේ දී රටින් බැහැරව යාම සඳහා රා.පරි.චක්‍රලේඛ 21/2007 ප්‍රකාරව අග්‍රාමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. ඒ අනුව, 2015.01.01 දින සිට 2015.12.31 දින දක්වා අනුමත කරන ලද විදේශ නිවාඩු පිළිබඳ සාරාංශය පහත සඳහන් වේ.

| අනු අංකය | අමාත්‍යාංශය | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 13 |
| 2 | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව (කාර්ය මණ්ඩල) | 55 |
| 3 | ආණ්ඩුකාර ලේකම් කාර්යාලය | 5 |
| 4 | ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය | 10 |
| 5 | විදේශ කටයුතු අමාත්‍යාංශය | 78 |
| 6 | අධිකරණ අමාත්‍යාංශය | 87 |
| 7 | බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය | 12 |
| 8 | සංචාරක සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය | 38 |
| 9 | තිරසර සංවර්ධන හා වනජීවී අමාත්‍යාංශය | 11 |
| 10 | ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය | 193 |
| 11 | සමාජ සවිබල ගැන්වීම් හා සුබසාධන අමාත්‍යාංශය | 30 |
| 12 | කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍යාංශය | 22 |
| 13 | උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය | 745 |
| 14 | නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යාංශය | 123 |
| 15 | ආපදා කළමනාකරණ අමාත්‍යාංශය | 102 |
| 16 | විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය | 63 |
| 17 | නීතිය හා සාමය සහ දක්ෂිණ සංවර්ධන අමාත්‍යාංශය | 2 |
| 18 | සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය | 382 |
| 19 | මුදල් අමාත්‍යාංශය | 848 |
| 20 | නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය | 88 |
| 21 | ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 13 |
| 22 | අභ්‍යන්තර කටයුතු, වයඹ සංවර්ධන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 32 |
| 23 | කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය | 266 |
| 24 | මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය | 12 |
| 25 | ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 85 |
| 26 | වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 119 |
| 27 | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය | 241 |
| 28 | කෘෂිකර්ම අමාත්‍යාංශය | 326 |
| 29 | බුද්ධ ශාසන අමාත්‍යාංශය | 7 |
| 30 | ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය | 33 |
| 31 | රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය | 7 |
| 32 | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය | 39 |
| 33 | පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යාංශය | 10 |
| 34 | නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය | 11 |

| | | |
|---|---|---|
| 35 | වරාය හා නාවික කටයුතු අමාත්‍යාංශය | 20 |
| 36 | ඉඩම් අමාත්‍යාංශය | 56 |
| 37 | කඳුරට නව ගම්මාන, යටිතල පහසුකම් හා ප්‍රජා සංවර්ධන අමාත්‍යාංශය | 3 |
| 38 | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය | 15 |
| 39 | විදේශ රැකියා අමාත්‍යාංශය | 108 |
| 40 | අධ්‍යාපන අමාත්‍යාංශය | 144 |
| 41 | තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යාංශය | 37 |
| 42 | ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 2 |
| 43 | ක්‍රීඩා අමාත්‍යාංශය | 13 |
| 44 | විදුලි සංදේශ හා ඩිජිටල් යටිතල පහසුකම් අමාත්‍යාංශය | 15 |
| 45 | ප්‍රාථමික කර්මාන්ත අමාත්‍යාංශය | 12 |
| 46 | වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශය | 54 |
| 47 | පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 7 |
| 48 | සංවර්ධන උපායමාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශය | 49 |
| 49 | ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය | 0 |
| 50 | විශේෂ කාර්යභාර අමාත්‍යාංශය | 0 |
| | **පාර්ලිමේන්තු මැතිවරණයට පෙර පැවති අමාත්‍යාංශ** | |
| 01 | ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව | 8 |
| 02 | නීතිය සාමය හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 9 |
| 03 | උසස් අධ්‍යාපන හා පර්යේෂණ අමාත්‍යාංශය | 1245 |
| 04 | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 451 |
| 05 | සංචාරක හා ක්‍රීඩා අමාත්‍යාංශය | 156 |
| 06 | නගර සංවර්ධන, ජල සම්පාදන හා ජලාපවාහන අමාත්‍යාංශය | 66 |
| 07 | නිවාස හා සමෘද්ධි අමාත්‍යාංශය | 34 |
| 08 | මහා මාර්ග හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 77 |
| 09 | රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය | 92 |
| 10 | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | 10 |
| 11 | සමාජ සේවා, සමාජ සංවර්ධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය | 49 |
| 12 | මහජන සාමය හා ක්‍රිස්තියානි කටයුතු අමාත්‍යාංශය | 16 |
| 13 | පළාත් පාලන හා ප්‍රාදේශීය සංවර්ධන අමාත්‍යාංශය | 8 |
| 14 | වැවිලි හා යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය | 2 |
| 15 | විශේෂ ව්‍යාපෘති අමාත්‍යාංශය | 9 |
| 16 | සංස්කෘතික කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | 10 |
| 17 | ළමා කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | 8 |
| 18 | වැවිලි කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය | 3 |
| 19 | අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය | 2 |
| 20 | තරුණ කටයුතු රාජ්‍ය අමාත්‍යාංශය | 25 |
| 21 | උසස් අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යාංශය | 54 |
| 22 | ගුවන් සේවා රාජ්‍ය අමාත්‍යාංශය | 39 |
| | **එකතුව** | **7016** |

## 7. මානව සම්පත් සංවර්ධනය, යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා මූල්‍ය ප්‍රගතිය

### 7.1 මානව සම්පත් සංවර්ධනය

අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිලධාරීන්ගේ දැනුම, කුසලතා සහ ආකල්ප වර්ධනය කිරීමත් එමගින් කාර්යාල කටයුතු වල කාර්යක්ෂමව, ඵලදායීව සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීමටත් දේශීය සහ විදේශීය පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් යොමු කරනු ලැබේ. ඒ අනුව, නිලධාරීන්ට 2015 වර්ෂය තුළ ලබා දී ඇති දේශීය හා විදේශීය පුහුණු පාඨමාලා පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

- **විදේශීය පුහුණු වැඩසටහන්**

| අනු අංකය | පාඨමාලාව | පුහුණු කාල සීමාව | රට | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1. | මානව සම්පත් සංවර්ධන වැඩමුළුව | 2015.04.28 - 2015.04.30 | ඉන්දියාව | 1 |
| 2. | සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා අදාළ සේවාවන් බාහිර පාර්ශවයන්ගෙන් ලබා ගැනීම සංවර්ධනය හා කළමනාකරණය පිළිබඳ සම්මන්ත්‍රණය | 2015.05.11 - 2015.05.28 | චීනය | 1 |
| 3. | සාර්ක් කලාපීය රටවල සංක්‍රමණ මත වන සංවර්ධන අභියෝග සහ ඉදිරි ක්‍රියාමාර්ග | 2015.06.07- 2015.06.11 | බංගලාදේශය | 2 |
| 4. | පරිගණක පුහුණු වැඩසටහන | 2015.06.10- 2015.07.11 | චීනය | 1 |
| 5. | හැකියා වර්ධන වැඩසටහන | 2015.09.06- 2015.09.18 | මැලේසියාව | 1 |
| 6. | සංවර්ධනය වෙමින් පවතින රටවල රාජ්‍ය මානව සම්පත් කළමනාකරණය | 2015.09.08- 2015.09.30 | චීනය | 2 |
| 7. | ආසියානු කලාපීය සංවර්ධනය වෙමින් පවතින රටවල් සඳහා සර්වග්‍රාහී වර්ධනය සහ ග්‍රාමීය ප්‍රදේශ වල තිරසාර වත්කම් හීනවීම පිළිබඳ සම්මන්ත්‍රය | 2015.09.11- 2015.09.27 | චීනය | 1 |
| 8. | ආසියානු රටවල මහජනතාව සඳහා රාජ්‍ය පරිපාලනය පිළිබඳ සම්මන්ත්‍රණය | 2015.10.09- 2015.10.31 | චීනය | 1 |
| 9. | ආසියානු රටවල මහජනතාව සඳහා රාජ්‍ය පරිපාලනය පිළිබඳ සම්මන්ත්‍රණය | 2015.10.09- 2015.10.29 | චීනය | 1 |
| 10. | ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරීන් සඳහා ප්‍රතිපත්ති හා නායකකරණය පිළිබඳ අධ්‍යයන චාරිකාව | 2015.11.27- 2015.12.07 | ඕස්ට්‍රේලියාව | 1 |

- **දේශීය පුහුණු වැඩසටහන් සහ පශ්වාත් උපාධි පාඨමාලා**

| අනු අංකය | පාඨමාලාවේ නම | පුහුණු ආයතනය | පුහුණු කාල සීමාව | සහභාගී වූ සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) | දින 10 | 2 |
| 02 | වෘත්තීයවේදීන් සඳහා උසස් ඉංග්‍රීසි ඩිප්ලෝමාව | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) | දින 10 | 1 |
| 03 | දෙමළ භාෂා පුහුණු පාඨමාලාව | රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව | පැය 62 | 50 |
| 04 | සුබෝධ්‍යා උපදේශන මඟින් විද්‍යාත්මක සංවාද වැඩසටහන | සමාජ සේවා සුබසාධන අමාත්‍යාංශය | පැය 5 1/2 | 50 |
| 05 | ඉංග්‍රීසි භාෂා පුහුණු පාඨමාලාව | රාජ්‍ය භාෂා දෙපාර්තමෙන්තුව | පැය 40 | 20 |
| 06 | දුරකථන ශිල්පීයක්‍රම හා මූලික කාර්යාල කළමනාකරණය | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය (SLIDA) | දින 02 | 50 |
| 07 | මූල්‍යකරණය හා ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්වාත් උපාධිය | කොළඹ විශ්වවිද්‍යාලය | අවුරුදු 2 | 3 |
| 08 | පශ්වාත් උපාධි පාඨමාලාව | කොළඹ විශ්වවිද්‍යාලය | අවුරුදු 2 | 1 |
| 09 | ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව (සමාජ විද්‍යාව) 2015/2016 | කැලණිය විශ්වවිද්‍යාලය | අවුරුදු 2 | 1 |
| 10 | ලේකම් කාර්යාල ක්‍රම පිළිබඳ උසස් සහතික පත්‍ර පාඨමාලාව | National Institute of Business Management (NIBM) | අවුරුදු 1 | 1 |

## 7.2 අග්‍රාමාත්‍ය කාර්යාලයේ ඵලදායීතාවය වර්ධනය කිරීම සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණය යොදා ගැනීම

ආග්‍රාමාත්‍ය කාර්යාලයේ විෂය පථය පුළුල්වීම හේතුකොට ගෙන ඵලදායී හා කාර්යක්ෂම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවාවක් ඇති කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයක් අලුතින් ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවාවේ සහකාර අධ්‍යක්ෂවරයෙක් යටතේ, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරීන්ගෙන් මෙම අංශය සමන්විත වේ.

"ඊ රාජ්‍ය ප්‍රතිපත්තිය" ට අනුගත වෙමින් අග්‍රාමාත්‍ය කාර්යාලයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික දුර්වලතා හා අවශ්‍යතා හඳුනා ගනිමින් අවශ්‍ය කටයුතු කිරීමත්, රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික අවශ්‍යතා සපුරාලීමත්, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ මූලික අභිමතාර්ථය වේ.

- **අන්තර්ජාල පහසුකම් සැපයීම හා ප්‍රතිවයිරසකරණය (Internet & Antivirus)**

අග්‍රාමාත්‍ය කාර්යාලයේ ජාලකරණ පද්ධතිය සඳහා නව පද්ධතියක් ස්ථාපිත කරන ලද (firewall) අතර එමගින් සියලුම නිලධාරීන්ට කාර්යක්ෂම අන්තර්ජාල සබඳතාවක් ලබා දී ඇත. කේන්ද්‍රීය ප්‍රතිවයිරස මෘදුකාංගයක් (Security Center) ස්ථාපිත කොට පරිගණක ජාලය ප්‍රතිවරසකරණය කිරීම තුලින් පරිඝණක ආරක්ෂා කිරීමට පියවර ගෙන ඇත.

- **අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය (Official Website)**

අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් සේවා ආයතනය මගින් ආකර්ෂණීය හා වඩාත් පහසුකම් වලින් යුතු වෙබ් අඩවියක් නිර්මාණය කරන ලදී. එමගින් පරිශීලකයන්ගේ පහසුව ඉතා ඉහළ මට්ටමකට වර්ධනය කල හැකි වූ අතර, වෙබ් අඩවිය නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම මගින් භාවිතාකරන්නන් හට කාලීන හා නිවැරදි තොරතුරු කඩිනමින් ලබාදීමට හැකියාව ලැබී ඇත. වෙබ් අඩවිය ස්ථාපනයේ ඇති ආරක්ෂණ ඌනතාවයන් (Security threats) හඳුනාගෙන ඒවා ඉවත් කිරීම සඳහා එය නව සර්වර්යක (virtual server) ස්ථාපිත කළ අතර, ක්‍රමලේඛනයේ (source code) වූ දෝෂ ඉවත් කිරීම මගින් වඩාත් සුරක්ෂිතතාවයකින් යුතුව අග්‍රාමාත්‍ය කාර්යාලයේ නිල වෙබ් අඩවිය දවසේ පැය 24 පුරාත්, වර්ෂයේ දින 365 පුරාත් සජීවීව පවත්වා ගනු ලැබේ. වෙබ් අඩවියේ පූර්ණ පාලනය මේ වන විට තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය සතුව පවතී.

- **අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර මේල් සර්වරය (Internet Mail Server)**

නව Firewall පද්ධතිය ස්ථාපිත කිරීම මඟින් අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර මේල් සර්වරයේ ආරක්ෂාව (Security) වැඩි කර ඇත.

- **අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර භාවිතය සඳහා මෘදුකාංග නිපදවීම**

අග්‍රාමාත්‍ය කාර්යාලයේ අභ්‍යන්තර ආයතන කටයුතු පහසු කර ගැනීම සඳහා අවශ්‍ය මෘදුකාංග තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මඟින් නිපදවීමට කටයුතු යොදා ඇත. එමඟින් මෘදුකාංග සඳහා යන වියදම අවම කර ගත හැකි අතර, අනුවාද ලෙස නවීකරණය කිරීමේ හැකියාවද (version update) පවතී.

අග්‍රාමාත්‍ය කාර්යාලයේ තැපැල් මගින් ලැබෙන ලිපි හා අභ්‍යන්තර ලිපිගොනු කළමනාකරණය කිරීම සඳහා මෘදුකාංග පද්ධතියක් නිර්මාණය කර අවසන් කර ඇති අතර එය ලේකම් කාර්යාලයේ සහ මහජන පැමිණිලි අංශයෙහි භාවිතයට යොදවා ඇත.

අග්‍රාමාත්‍ය කාර්යාලයේ ලිපි ගොනු සංරක්ෂණය කිරීම සඳහා නිදහස් මෘදුකාංගයක් මත සකසන ලද ඊ - පුස්තකාල පද්ධතියක් සැකසීම පිළිබඳව අධ්‍යයනය කරමින් පවතී.

- **රාජ්‍ය ප්‍රතිපත්ති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම**

අග්‍රාමාත්‍ය කාර්යාලය හරහා ක්‍රියාත්මක කෙරෙන රජයේ ප්‍රතිපත්ති හා වැඩසටහන් වලට අදාළව තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික අවශ්‍යතා සපුරාලීම තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශය මැදිහත්වී ක්‍රියා කරනු ලැබේ. ඒ අනුව ග්‍රාමීය පොළ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා තොරතුරු ඇතුළත් කිරීමට වෙබ් අඩවියක් නිර්මාණය කිරීම, ශ්‍රී ලංකා ටෙලිකොම් සේවා ආයතනය සම්බන්ධීකරණය කිරීම සිදු කරමින් පවතී.

ආයතනයේ පහත සඳහන් කටයුතු සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ අංශයේ සහාය ලබාදෙනු ඇත.

1. කාර්ය මණ්ඩලයේ නිලධාරීන්ගේ ප්‍රායෝගික තොරතුරු තාක්ෂණික පුහුණු අවශ්‍යතා හඳුනා ගැනීම හා අවශ්‍ය පුහුණුව ලබාදීම
2. ආයතනයේ තොරතුරු තාක්ෂණික ක්‍රියාකාරී සැලැස්ම යාවත්කාලීන කිරීම හා ක්‍රියාත්මක කිරීම
3. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයට අදාළ සේවා ගිවිසුම් අත්සන් කොට යාවත්කාලීනව පවත්වාගෙන යාම
4. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ මිලදී ගැනීම් සඳහා අදාළ පිරිවිතර සැකසීම හා නිර්දේශයන් ලබාදීම

## 7.3. මූල්‍ය ප්‍රගතිය

අරලියගහ මන්දිර පරිශ්‍රයේ ඉදිකරනු ලබන නව තෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මේ වන විට නිමවෙමින් පවතී. මෙම ඉදිකිරීම් කටයුතු සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ ශ්‍රම දායකත්වය සපයන අතර, ගොඩනැගිලි ද්‍රව්‍ය අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් සපයා දෙනු ලබයි. මෙම ක්‍රමවේදය මඟින් අවම පිරිවැයක් යටතේ ඉහළ ගුණාත්මකතාවයකින් යුත් තෙමහල් ගොඩනැගිල්ලක් ඉදි කර ගැනීමට හැකි වී ඇත.

2015 වර්ෂය සඳහා වූ ප්‍රාග්ධන පිරිවැය පහත පරිදි වේ

| අනු අංකය | ක්‍රියාකාරකම | වැය කළ මුළු මුදල | සටහන |
|---|---|---|---|
| 1. | නව ගොඩනැගිලි ඉදිකිරීම | රු 10,068,857.02 | 1 |
| 2. | ගොඩනැගිලි නඩත්තු කටයුතු | රු 31,249,652,96 | 2 |
| 3. | වාහන මිලදී ගැනීම | රු 5,190,446.00 | 3 |
| 4. | ගෘහ භාණ්ඩ සහ කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | රු 24,483,193.11 | |
| 5. | යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීම | රු 481,546.19 | |

**<u>සටහන 01</u>**

- ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා අනුමත ඇස්තමේන්තු මුදල රු.36,926,488.50
- 2015 වර්ෂයේ දී ජනාධිපති කාර්යාලය විසින් සපයා ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය වල වටිනාකම රු. 20,652,159.20
- 2015 වර්ෂයේ දී අගමැති කාර්යාලය විසින් සපයා ඇති ගොඩනැගිලි ද්‍රව්‍ය වල වටිනාකම රු. 9,974,250.77
- මහ භාණ්ඩාගාරයෙන් ලද මුදල රු. 16,000,000.00

**<u>සටහන 02</u>**

- අග්‍රාමාත්‍ය කාර්යාලය, අරලියගහ මන්දිර ගොඩනැගිල්ල හා නුවරඑළිය නවාතැන් බංගලාව ප්‍රතිසංස්කරණය කිරීම

**<u>සටහන 03</u>**

- අග්‍රාමාත්‍ය කාර්යාලයේ ලිපි බෙදා හැරීමේ කටයුතු කඩිනම් කිරීම සඳහා නව යතුරු පැදි 02ක් මිලදී ගෙන ඇති අතර ඒ සඳහා වැය කළ මුදල රු. 324,200.00
- අග්‍රාමාත්‍ය කාර්යාලය සඳහා කල්බදු සේවා පදනම යටතේ වාහන 04 ක් ලබාගෙන ඇති අතර ඒ සඳහා 2015 වර්ෂයේ දී වැය කර ඇති මුදල රු. 4,866,246.00